# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 70 — 1973 ජූලි 27 වැනි සිකුරාද — 1973.07.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ලෝක් පාලන නිවේදන ... ... ... | 717 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 723 |
| කොන්ත්‍රාත්-ඇණවුම් ... ... ... | 719 | අය-වැය ලේඛන ... ... ... | 735 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 722 | දේපල විකිණීම ... ... ... | 739 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 722 | මැතිවරණ පෙත්සම් දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද කොමසාරිස් ගැසට් දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... | 741 |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍ය කාර්යාංශ පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනත 1973 ජූලි 27 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

## පළාත් පාලන නිවේදන

### අවිස්සාවේල්ල නගර සභාව

#### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් රාජ්‍ය, පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් සාදනු ලැබූ රීතිය.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

1973 ජූලි මස 9 වැනි දින,
කොළඹ දීය.

##### රීතිය

(176 වන අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දක්වීමේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ සාදන ලද්දවූ ද 1965 දෙසැම්බර් 17 වැනි දින අංක 14,587 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ රීතියෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද්දවූ ද 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ රීති, එහි 3අ වැනි රීතියෙහි දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් වෙනුවට පහත සඳහන් නව ගාස්තු ප්‍රමාණයන් ආදේශ කිරීමෙන්, අවිස්සාවේල්ල නගර සභාවේ පරිපාලන සීමාවට ඇතුළත් වන ප්‍රදේශයට අදාළ වනතාක් දුරට තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ. : —

| | එක් දිනකට | | එක් මසකට | | දෙසැම්බර් 31 වනදයින් අවසන් වන එක් වර්ෂයකට | |
|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| ආසන පහසුකම් සපයනු ලබන පුද්ගලයින්ගේ ගණන 199ට වැඩි නොවන විට ... | 3 | 0 | 50 | 0 | 450 | 0 |
| ආසන පහසුකම් සපයනු ලබන පුද්ගලයින්ගේ ගණන 199ට වැඩි නමුත් 399ට වැඩි නොවන විට ... ... ... ... | 5 | 0 | 75 | 0 | 750 | 0 |
| ආසන පහසුකම් සපයනු ලබන පුද්ගලයින්ගේ ගණන 399ට වැඩි වන විට ... | 10 | 0 | 100 | 0 | 900 | 0 |

7-996—73.07.27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට යෙදෙන කාලසීමා සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වමින්, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියලුදෙනාගේ අවධානය යොමු කෙරේ. එකී නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියලුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. දුරකථන පණිවුඩ මගින් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1973 ජනවාරි 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

### ගෝඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නියි බලධරයා විසින් එනම් යාපනය දිස්ත්‍රික්කයේ පන්ඩිතරිප්පූ නගරයේ විශේෂ කොමසාරිස් විසින් සම්පාදිතව එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

ගෝඝාතක ආඥාපනත යටතේ ප්‍රකාශ කරන ලද පොදු ගෝඝාතක ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා ගේ හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකයකුගේ භාරයේ තිබිය යුතුය. එකී ගෝඝාතක ස්ථානය ඇතුළත මනා පරිපාලනය හා සනීපාරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් ඒ නිලධරයා වග කිව යුතුය.

2. (1) කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු—

(අ) සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ විශේෂ කොමසාරිස් විසින් එම කාර්යය සඳහා බලය පවරන ලද නිලධරයකු විසින් ඒ සතා පරීක්ෂා කොට මනුෂ්‍ය ආහාරය පිණිස මැරීම සුදුසු යයි අනුමත කර තිබේ නම් ද,

(ආ) යම් දිනක පූ. භා. 8 ත් දහවල් 12 ත් අතර කාල යේදී ද, මිස ගෝඝාතක ස්ථානයේ දී නොමැරිය යුතුය.

එසේ වුවද, විශේෂ අවස්ථාවක දී මෙහි නිශ්චිතව සඳහන් වේලාවට වෙනස් වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා විශේෂ කොමසාරිස් විසින් බලය දිය හැකිය.

(2) කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු—

(අ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 30 ක කලායක් ගතවූ වාට පසු යම් වේලාවක ද,

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා ගෝඝාතක ස්ථානයට අයිති භූමියෙන් පණ පිටින් ඉවත් කර ඇත්තේ නම් ඒ සතා නැවතත් පරීක්‍ෂා කොට මනුෂ්‍ය ආහාරය පිණිස මැරීම සුදුසු යයි එම ඡේදය යටතේ අනුමත කර නොමැතිනම් ද, ගෝඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

3. ගෝඝාතක ස්ථානයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා ගෝඝාතක ස්ථානයට අයිති භූමියෙහි නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකව ලැබීම සඳහා අවශ්‍ය වූ සෑම විධි විධානයක්ම යෙදිය යුතුය.

4. ගෝඝාතක ස්ථානයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා මැරීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම්, එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ගෝඝාතක ස්ථානය පිහිටි භූමියෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

5. යම් සතකු 2 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු, ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ට ආහාර පිණිස මැරීම නුසුදුසු බව හෝ පෙනී ගියහොත්, 2 වැනි නියෝගයෙහි සඳහන් යම් නිලධරයකු විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

6. ගෝඝාතක ස්ථානයෙහිදී මරණ ලද යම් සතකුගේ මස් හෝ මාංසාවශේෂ 2 වැනි නියෝගයෙහි සඳහන් වූ යම් නිලධරයකුගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මනුෂ්‍ය ආහාරයට නුසුදුසුව තිබේ නම් ඔහු විසින් ඒ මස් හෝ අවමස් ආදිය වහාම විනාශ කර දැමීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත් ඒ මස් හෝ අවමස් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මනුෂ්‍ය ආහාරය පිණිස ගැනීම හෝ වලකින අන්දමින් ඉවත් කරවීම කළ යුතුය.

7. මනුෂ්‍ය ආහාරය පිණිස මැරීම සුදුසුය යි අනුමත කර නැත්තා වූ හෝ 5 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නා වූ හෝ කිසිම සතකු මැරීමට ගෝඝාතක ස්ථානය භාර වූ නිලධරයා විසින් අවසර නොදිය යුතුය.

8. (1) කිසිම තැනැත්තකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි, නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ මාංසාවශේෂයක් 2 වැනි නියෝගයෙහි සඳහන් වූ යම් නිලධරයකුගේ නියමය යටතේ මිස ගෝඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

(2) මනුෂ්‍ය ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණුපයේ ඉස්සරහ ගාත් වලත් පස්සා ගාත් වලත ගෝඝාතක ස්ථානය භාර වූ නිලධරයා විසින් පො. සු. න ස. යන ලකුණ හා අවස්ථාවෝචිත පරිදි "ගව මස්" හෝ "එළු මස්" යන වචන මුද්‍රා තබා තිබේ නම් මිස ගෝඝාතක ස්ථානයෙන් ඉවත් නො කළ යුතුය.

9. වෙනයම් සතකු ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරණ ලද සෑම සතකුගේම කුණපය ඒ ස්ථානයෙන් ඉවත් කරන තුරු කිසිම සතකු නොමැරිය යුතුය.

10. (1) මෙහි මින්මතු විධිවිධාන යොදා ඇති ආකාරයට යටත්ව ගෝඝාතක ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් අය කළ යුතුය.

| | | දිනකට රු. ශ. |
|---|---|---|
| ගවයකුන් සඳහා එකකුට | ... ... | 2 0 |
| බැටළුවන් හෝ එළුවන් සඳහා එකකුට | ... | 1 0 |

එසේ වුවද ගෝඝාතක ස්ථානයට ගෙන එන ලද සතකු මැරීම සඳහා නුසුදුසු යයි ප්‍රතික්ෂේප කරනු ලැබූ විට ඒ සතා සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තුව රු. 1 ක් පමණක් විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ ගාස්තුව, එකී සතා සම්බන්ධයෙන් විශේෂ කොමසාරිස්ට එකී ගාස්තුව ගෙවූ බවට ලබාගත් නිල කුවිතාන්සිය ගෝඝාතක භාරකරු වෙත හෝ එකී කුවිතාන්සිය ඉදිරිපත් කළයුතු තැනැත්තා වශයෙන් විශේෂ කොමසාරිස් විසින් ලියවිල්ලකින් පත්කළ හැකි වෙනයම් නිලධරයකු වෙත ඉදිරිපත් කරන තුරු ගෝඝාතක ස්ථානය තුළ සතුන් මැරීම හෝ එම ස්ථානයෙන් සතුන් ඉවත් කිරීම හෝ නොකළ යුතුය.

11. ගෝඝාතක ස්ථානය භාරකරු විසින් ගෝඝාතක ස්ථානයේදී මරනු ලබන සියළුම ගවයන්ගේ ලේඛණයක්ද, සියළුම එළුවන්ගේ සහ බැටළුවන්ගේ ලේඛණයක්ද තබා ගත යුතුය. ඒ ලේඛණය පහත සඳහන් ආකෘතියට සාරානුකූලව විය යුතුය. :—

ගව වවුචරයේ අංකය :————.

විස්තරය :————.

පාට :————.

වයස :————.

හඳුනා ලකුණු :————.

දකුණු පැත්ත :————.

වම් පැත්ත :————.

ගෝඝාතකයාගේ නම :————.

හරක් කොටුවට ඇතුල් කළ වේලාව සහ දිනය :————.

පරීක්ෂා කළ බැලූ දිනය :————.

ඝාතනය කළ දිනය :————.

හරක් භාරගන්නා නිලධාරියාගේ කෙටි අත්සන :————.

වෙනත් කරුණු :————.

12. මේ නියෝගවල—

"විශේෂ කොමසාරිස්වරයා" යනුවෙන් නගර සභා ආඥාපනතේ 183 වැනි වගන්තිය යටතේ පන්ඩිතෙරිප්පු නගරය පාලනය කිරීමට පත් කළ විශේෂ කොමසාරිස්වරයා අදහස් වේ.

"සභාව" යනුවෙන් පන්ඩිතෙරිප්පු සුළු නගර සභාව අදහස් වේ.

"සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා" යනුවෙන් මානිපායි සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"ආඥාපනත" යනුවෙන් (272 වැනි අධිකාරය වන) ගෝඝාතක ආඥාපනත අදහස් වේ.

7-1041—73.07.27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම්, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා නියුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් සලකනු ලබන පුරප්පාඩු සඳහා වයස සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය මණ්ඩලයන්හි සේවකයන්ට හැකිවේ.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය මණ්ඩලවල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුය.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට කමත් සූදානම්ව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. එම සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් සැපයීමට යම් කැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාගේ සහතික පත්‍රයක් මගිනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර ආන්දමකින් වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට අවිධිමත් ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් කොමිෂනයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැල්දී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

**අභ්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය**

**පළාත් පාලන සේවය**

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සෑම අතින්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්. අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

————————————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :———.
(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :———.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :———.
ජාතිය :———.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, හැඳුනුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :———.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—.
අවුරුදු :———. මාස :———. දින :———.

(ආ) උපන් දිනය :—.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :———

(ආ) අයදුම්කරුගේ පියා :———.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :———.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :———.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඇ) පිරවිය යුතුය.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :———.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාසැල්, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාසැලෙහි හෝ විද්‍යාලයේ | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ) —

| සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය —

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවකි යෙදී සිටියේ නම් සහ ඒ සේවය හැර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :——.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භවයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව කුවීණ තාවක් ඇද්ද :

(අ) සිංහල :————

(ආ) දෙමළ :————

13. විශේෂ සුදුසුකම්.—ඉහත නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මඟින් වරදකරු කරනු ලැබුවේද, එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල මුළු ණය කොපමණද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ කිවීනම් ආදිය) :————

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————

අයදුම්කරුගේ අත්සන

දිනය :————,

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,

තැ.පෙ. 530, කොළඹ 1.

---

පළාත් පාලන සේවය—පාලන සහකාර තනතුර

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප :—තනතුරට නියමිත ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 6,720—11×360—රු. 10,680 යි.

3. සුදුසුකම් :

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් ඇති පළාත් පාලන සේවයේ ලේකම්වරුන් හෝ ලිපිකරුවන් විය යුතුය.

නැතහොත්

(ii) 1973.09.15 දිනට රු. 6,600කට නොඅඩු ස්ථිර වාර්ෂික වැටුපක් ලබන, නාගරික ගිණුම් කටයුතු සහ පරිපාලනය පිළිබඳව දැනුමක් හා පළපුරුද්දක් ඇති ලේකම්වරුන් හෝ ලිපිකරුවන් විය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, 1973. 09. 15 වැනි දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වැනි විෂයය වෙනුවට පහත සඳහන් පරිදි යොදා ගත යුතුයි.

"13. (අ) පරිපාලනමය පළපුරුද්ද පිළිබඳ විස්තර.

(ආ) නාගරික ගිණුම් කටයුතු සහ පරිපාලනමය පළපුරුද්ද පිළිබඳ විස්තර."

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර භාර දෙන ලද බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලද බව දන්වා එවනු ලැබේ.

8. අයදුම්පත එවන කවරයේ වම් කෙළවරෙහි 'පාලන සහකාර තනතුරු' යන වචන පැහැදිලිව ලියා තිබිය යුතු වේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,

1973 ජූලි මස 16 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

7-955 —73. 07. 27 අංක 70 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් පාලන සේවය**

**2 වැනි ශ්‍රේණියේ පොත් තබන්නන්ගේ තනතුර—1973**

ඉහත සඳහන් තනතුරුවලට පත්කිරීම සඳහා පහත නම් සඳහන් අයදුම්කරු වන්, පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරා ගෙන ඇති බව මෙයින් දන්වමි :—

| නම | | ලිපිනය |
|---|---|---|
| 1. එම්. ඒ. ආර්. හුසේන් | ... | 111/41, අබ්දුල් හමීඩ් මාවත, කොළඹ 12. |
| 2. එස්. කොඩිතුවක්කු | ... | අංක 8, ජාතික නිවාස, සිරිමල් වත්ත, ගුන්නෑපාන. |
| 3. පී. එම්. විමලවංශ | ... | "දයානි", තොටමුණ පාර, තොටමුණ, මාතර. |
| 4. බී. ඩී. ඩැනී | ... | 150, වෙන්දේසි වත්ත, දිබ්බැද්ද, පානදුර. |
| 5. ඩබ්ලිව්. පී. දයානන්ද | ... | 33/7, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ. |
| 6. බී. එච්. විමලසේන | ... | ගාල්ල වත්ත, කෝට්ටගොඩ, ස්ප්‍රින්වැලි. |
| 7. එච්. එම්. විජේසිංහ | ... | 69/66, විශ්ව විද්‍යාල මාවත. රත්නපිටිය, බොරලැස්ගමුව. |
| 8. ටී. එම්. බංඩා | ... | අඹන්ගෙදර, දුහුල්පොල, වැලිමඩ. |
| 9. එස්. එම්. පියසේන | ... | 142, පන්සල පාර, මහරගම. |
| 10. ඩබ්. ඒ. ආරියදාස | ... | ගල්කඩුල්ල, ගනේගොඩ. |
| 11. ඩී. පී. ඉන්ද්‍රසේන | ... | 189, පහළ බෝමිරිය, කඩුවෙල. |
| 12. පී. ඒ. ආර්. ලීලාරත්න | ... | "ලීලාවාස", මාකොල. |
| 13. පී. ඒ. නන්දසිරි | ... | 34, ඔන්නන්තර, හොරන පාර, පිලියන්දල. |
| 14. එල්. කේ. කේ. සෝමරත්න | | බටයිර කලවුවාව, තුම්මෝදර. |
| 15. කේ. එම්. පොඩි බංඩා | ... | පිටවල පාර, කඩිගමුව, අත්තම්පිටිය, රඹුක්කන. |
| 16. කේ. පංචනාදන් | ... | පයිරිකුඩාල්, කරෙයිනගර්. |
| 17. ආර්. ඩී. වික්‍රමනායක | ... | බොනවිස්ටාව, උණවටුන. |
| 18. පී. සින්නතුරෙයි | ... | කච්කුලි උතුර, චාවාකච්චේරි. |
| 19. එස්. ආර්. එම්. ජයරත්න | ... | නිද්දනාගම කනන්කේ වැව. |
| 20. ඒ. ඩබ්. එම්. රියල් | ... | වැලිපිටිය, වැලිගම. |
| 21. එච්. ඒ. ඒ. තිසේරා | ... | සාන්ත අන්තෝනි දෙව්මැදුර, උතුරු බටගම, ජාඇල. |
| 22. පී. ඒ. බුද්ධදාස | ... | 'සුදම්' අන්දුගොඩ, දික්කුඹුර. |

මෙම අපේක්ෂකයින්ට වහාම පත්වීම් දීම කොමිෂන් සභාව භාර නොගනී. පුරප්පාඩු ඇතිවන විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

එඩිගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973 ජූලි මස 10 දින,
තැ. පෙ. 530,
කොළඹ.

7-860—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී.—බී. 28/58.

**තෙල්ලිඅඩි සුළු නගර සභාව**

**සුළු නගර සභා ආඥාපනත**

**(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 දරණ වගන්ති යටතේ තෙල්ලිඅඩි සුළු නගර සභාව විසින් සම්පාදිතව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින්, එකී ආඥාපනතේ 153 වන වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.**

ජී. බී. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1972 ජූනි මස 25 වැනි දින,
කොළඹ දී ය.

**අතුරු ව්‍යවස්ථා**

1. කිසිම වාහනයක්, පේදුරුතුඩුව-යාපනය පාරේ තෙල්ලිඅඩි හන්දියේ සිට යාපනය පැත්තට යාර 120 ක දුරද, පේදුරුතුඩුව පැත්තකට යාර 70 ක දුරද, කොඩිකාමම් පාරේ යාර 60 ක දුරද අල්වෙයි පාරේ යාර 60 ක දුරද, නවතා නොතැබිය යුතුයි.

2. වාහන නැවැත්වීම හෝ නවතා තැබීම (1) වැනි ඡේදයේ විධිවිධාන පරිදි තහනම් කොට ඇති ප්‍රදේශයන්හි වාහන පදවන යම් රියැදුරකු විසින්, පහත සඳහන් කාර්යයන් සඳහා අවශ්‍ය කාලය තුළ පමණක් මිස, ඒ වාහනය නවත්වා තැබීම නොකළ යුතුය :—

(අ) එම වාහනයෙන් කෙනකු බැසීම හෝ ඊට ගොඩවීම, හෝ

(ආ) එබඳු වාහනයකින් බඩු බෑම හෝ එයට බඩු පැටවීම, හෝ

(ඇ) යම් නිලධාරියෙකු හෝ බලමණ්ඩලයක් විසින් ප්‍රදර්ශනය කර ඇති යම් මාර්ග සංඥා හෝ දැන්වීම් පිළිපැදීම, හෝ

(ඊ) එම වේලාවේ ඇති වාහන ගමනාගමනය යථා පරිදි අනුගමනය කිරීම, හෝ

(උ) එම වාහනය නවතා තැබීම සඳහා තෙල්ලිඅඩි සුළු නගර සභාව විසින් නිකුත් කොට ඇති බලයක් හෝ අවසරයක් පිළි පැදීම.

3. මෙම අතුරු ව්‍යවස්ථාවල 1 වන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කිරීමේ වරද කරන කවර අයකු හෝ රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතුය. මෙම අතුරු ව්‍යවස්ථාවල—

4. "හන්දිය" යන්නෙන් පාරවල් හතරම එනම්—
යාපනය-පේදුරුතුඩුව හා අල්වෙයි-කොඩිකාමම් යන පාරවල් හමුවන ස්ථානයෙහි තෙල්ලිඅඩි හන්දිය අදහස් කෙරේ,

"නවතා තැබීම" යන්නෙන් වාහනයක් ඉහත සඳහන් කාර්යයන් සඳහා හැර වෙනත් කවර කාර්යයක් සඳහා, අවිනිශ්චිත කාලයක් තුළ නවතා තැබීම අදහස් කෙරේ.

"වාහනය" යන්නෙන් සියලු මෝටර් වාහන අදහස් කැරෙන අතර, බයිසිකල්, ට්‍රයිසිකල් සහ ගොන් බැඳි කරත්ත හෝ, මිනිසුන් හෝ බඩු ප්‍රවාහනය කිරීම සඳහා යොදනු ලබන හෝ යෙදිය හැකි, යම් කෘතිම උපක්‍රමයකින් සාදන ලද දෙයක් ඊට ඇතුළත් වේ.

7-985—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

**බලන්ගොඩ නගරය**

නගර සභා ආඥාපනත

**බලන්ගොඩ නගරයේ විශේෂ කොමසාරිස් විසින් (255 වන අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 වන සහ 157 වන වගන්ති යටතේ සාදනු ලැබ, එම ආඥාපනතේ 154 වන වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.**

ජී. බී. වික්‍රමනායක,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1973.07.03.

**අතුරු ව්‍යවස්ථා**

1969 අප්‍රේල් මස 03 වෙනි දින අංක 14,848 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, බලන්ගොඩ නගර සභාව විසින් සම්පාදිත පොළවල්වලට අදාල වන අතුරු ව්‍යවස්ථා මෙහි පහත සඳහන් අන්දමට සංශෝධනය කරනු ලැබේ.

1. ඒ අතුරු ව්‍යවස්ථාවල "ඉරිදා පොල" යන වචන සඳහන් වන සෑම තැනකම ඒ වචන වෙනුවට "බලන්ගොඩ මහජන පොල" යන වචන ආදේශ කිරීමෙන්.

7-995—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සාදන ලදුව, ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ජේ. බී. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973.7.12 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

#### කසල ශෝධනය

මලපවහනය හා කසල ශෝධනය පිළිබඳව සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල VI වැනි කොටසේ II වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කසල ශෝධනය වෙනුවෙන් සභාවට මාසයක් පාසා ගෙවිය යුතු ගාස්තුව එක් එක් ස්ථානයකින් ශත පණහක් විය යුතුය.

7-931—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ කොට්ටව ගම් ප්‍රදේශයේ පරිපාලන නිලධාරී විසින් සම්මත කර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති තුමා විසින් එකී ආඥාපනතේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවැරී ඇති බලතල ප්‍රකාර අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ජේ. බී. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති තුමාගේ
අතිරේක ලේකම්.

කොළඹ, 1973. 07. 12 දින.

### ආයුර්වේද බෙහෙත් ශාලා

ගාලු දිස්ත්‍රික්කයේ කොට්ටව ගම් ප්‍රදේශයේ පරිපාලන නිලධාරී විසින් සම්මත කර 1973 මැයි 25 හා අංක 61 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද පොදු අතුරු ව්‍යවස්ථාවල 40 වැනි කාණ්ඩයේ අතුරු ව්‍යවස්ථා පහත දැක්වෙන අයුරු මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(i) පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 40 වැනි කාණ්ඩයේ අංක 4 දරණ අතුරු ව්‍යවස්ථාව මෙයින් ඉවත් කිරීමෙන් හා

(ii) පහත දැක්වෙන අළුත් අතුරු ව්‍යවස්ථාව ඒ වෙනුවට ආදේශ කිරීමෙන්

" (4) බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා එකී බෙහෙත් ශාලාවෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන එක් ලෙඩෙකුගෙන් -/75ක ගාස්තුවක් අය කළ යුතුයි."

7-930—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

## ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

### කුලියාපිටිය නගර සභාව

1972.12.31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

සාමාන්‍ය අංශය

| වැය විස්තර | රු. ශ. | අය විස්තර | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් ... ... ... | 80,386 46 | අතිරික්තය 1972.01.01 දිනට (ගැලපීම් කළ පසු) ... | 1,91,949 12 |
| බී.—මහා මාර්ග ... ... ... | 35,525 25 | ඒ.—සාමාන්‍ය ආදායම් ... ... ... | 1,89,406 19 |
| සී.—තානායම් ... ... ... | 10,455 02 | බී.—මහා මාර්ග :— | |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 44,161 62 | (1) කම්කරු බදු වෙනුවට ආධාර ... ... | 885 33 |
| ඊ.—මහජන සෞඛ්‍යය ... ... ... | 2,92,039 97 | සී.—තානායම් ... ... ... | 6,086 52 |
| එෆ්.—මහජන විනෝදය ... ... | 2,016 0 | ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... ... | 12,716 59 |
| ජී.—සොහොන් බිම් ... ... ... | 3 913 60 | ඊ.—මහජන සෞඛ්‍යය ... ... ... | 1,71,593 60 |
| එච්.—සුනඛයින් ලියාපදිංචි කිරීම ... ... | — | එෆ්.—මහජන විනෝදය ... ... | 31,809 25 |
| අයි.—කිරුම් හා මිනුම් ... ... ... | 786 96 | ජී.—සොහොන් බිම් ... ... ... | 300 0 |
| ජේ.—ගිනි නාශක බඳුන් පිරවීම ... ... | 37 0 | එච්.—සුනඛයින් ලියාපදිංචි කිරීම ... ... | 63 50 |
| එල්.—කියවීම් ශාලා හා පුස්තකාල ... ... | 10,685 52 | අයි.—කිරුම් හා මිනුම් ... ... ... | 1,524 50 |
| එම්.—කිරි වෙළඳාම ... ... ... | 34,816 70 | එල්.—කියවීම් ශාලා සහ පුස්තකාල ... ... | 30 60 |
| අතිරික්තය 1972.12.31 දිනට ... ... | 1,29,842 80 | එම්.—කිරි වෙළඳාම ... ... ... | 38,301 70 |
| | 6,44,666 90 | | 6,44,666 90 |

කුලියාපිටිය නගරයේ විශේෂ කොමසාරිස් කේ. බී. සත්කුමාර වන මම, ඉහත සඳහන් වාර්තාව මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1972 දෙසැම්බර් මස 31 දිනට කුලියාපිටිය නගර සභාවේ සාමාන්‍ය අංශයේ ආදායම් හා වියදම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත්, වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

කේ. බී. සත්කුමාර,
විශේෂ කොමසාරිස්, කුලියාපිටිය නගරය.

1973 ජූලි මස 10 වෙනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඇස්. සුගතපාල,
සමාදාන විනිශ්චයකාර තැන.

1973 ජූලි මස 10 වෙනි දින,
කුලියාපිටිය, විශේෂ කොමසාරිස් කාර්යාලයේදීය.

## 1972.12.31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

### විදුලිය අංශය

| වැය විස්තර | රු. | ශ. | අය විස්තර | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඊඊ.—(1) විදුලි බලය නිෂ්පාදනය ... ... | 1,24,943 | 11 | අතිරික්තය 1972.01.01 දිනට ... ... | 60,091 | 35 |
| (2) අළුත්වැඩියා හා නඩත්තු කිරීම ... | 31,139 | 82 | ඊආර්. (1) විදුලි බලය විකිණීම ... ... | 2,58,294 | 41 |
| (3) කම්බිවලට හා නිවෙස්වලට යා කිරීමේ සේවය | 18,464 | 68 | (3) පාරිභෝගිකයින් සඳහා කෙරෙන වැඩ ... | 14,197 | 94 |
| (4) පාලනය හා සාමාන්‍ය වියදම් ... ... | 38,591 | 21 | (4) මිශ්‍ර අය ... ... ... | 8,102 | 28 |
| (5) ණය ගාස්තු ... ... ... | 10,111 | 15 | (5) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 5,940 | 0 |
| (6) දීර්ඝ කිරීම හා වැඩිදියුණු කිරීම ... | 6,303 | 0 | (6) අතුරු දීමනා ... ... ... | 3,510 | 0 |
| (7) වටිනාකම අඩුවීම නිසා වෙන් කිරීම ... | 1,500 | 0 | | | |
| (11) විවාහ දීමනා ... ... | 1,170 | 0 | | | |
| අතිරික්තය 1972.12.31 දිනට ... ... | 1,17,913 | 1 | | | |
| | 3,50,135 | 98 | | 3,50,135 | 98 |

කුලියාපිටිය නගරයේ විශේෂ කොමසාරිස් කේ. බී. සත්කුමාර වන මම, ඉහත සඳහන් වාර්තාව මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1972 දෙසැම්බර් මස 31 දිනට කුලියාපිටිය නගර සභාවේ විදුලිය අංශයේ ආදායම් හා වියදම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත්, වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

කේ. බී. සත්කුමාර,
විශේෂ කොමසාරිස්, කුලියාපිටිය නගරය.

1973 ජූලි මස 10 වෙනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඇස්. සුගතපාල,
සමාදාන විනිශ්චයකාර තැන.

1973 ජූලි මස 10 වෙනි දින,
කුලියාපිටිය, විශේෂ කොමසාරිස් කාර්‍යාලයේදීය.

## වර්ෂ 1972.12.31 දිනට කුලියාපිටිය නගර සභාවේ දක්වෙන වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

| | සාමාන්‍ය රු. | ශ. | විදුලිය රු. | ශ. | එකතුව රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන අරමුදල ... | 1,66,831 | 91 | 78,468 | 63 | 2,45,300 | 54 |
| දීර්ඝකාලීන වගකීම් : | | | | | | |
| දේශීය ණය සහ සංවර්ධන අරමුදල ... | 8,92,600 | 9 | — | | 8,92,600 | 9 |
| ජංගම වගකීම් : | | | | | | |
| ලංකා විදුලිබල මණ්ඩලය | 1,050 | 7 | 24,213 | 0 | 25,263 | 7 |
| විවිධ ණය හිමියෝ ... | 31,272 | 26 | — | | 31,272 | 26 |
| ගබඩා ණය හිමියෝ ... | 1,859 | 51 | 921 | 62 | 2,781 | 13 |
| තැන්පත් ... | 90,493 | 74 | 73,308 | 65 | 1,63,802 | 39 |
| වියදම් නොවූ රජයේ ආධාර : | | | | | | |
| තානායම් ආධාර ... | 1,332 | 34 | | | | |
| පුස්තකාල ආධාර ... | 2,795 | 87 | | | | |
| ක්‍රීඩා භූමි විශේෂ ආධාර ... | 1,083 | 52 | — | | 5,211 | 73 |
| විදුලි දෙපාර්තමේන්තුවේ ක්ෂය සංචිතය ... | — | | 18,500 | 0 | 18,500 | 0 |
| අතිරික්තය 1972.12.31 දිනට | 1,29,842 | 80 | 1,17,913 | 1 | 2,47,755 | 81 |
| | 13,19,162 | 11 | 3,13,324 | 91 | 16,32,487 | 2 |

| | සාමාන්‍ය රු. | ශ. | විදුලිය රු. | ශ. | එකතුව රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් : | | | | | | |
| වාහන ... ... | 58,699 | 58 | — | | 58,699 | 58 |
| උපකරණ... ... | 1,08,132 | 33 | 78,468 | 63 | 1,86,600 | 96 |
| ණය යෝජනා ක්‍රය ... | 8,92,600 | 9 | — | | 8,92,600 | 9 |
| ස්ථාවර තැන්පත් ... | 1,000 | 0 | 18,500 | 0 | 19,500 | 0 |
| ජංගම වත්කම් : | | | | | | |
| ගබඩා තොග ගිණුම ... | 39,077 | 65 | 53,746 | 5 | 92,823 | 70 |
| සේවක අත්තිකාරම් ... | 19,999 | 56 | 21,560 | 0 | 41,559 | 56 |
| විවිධ ණය ගැතියෝ ... | 60,984 | 78 | 734 | 95 | 61,719 | 73 |
| ලැබිය යුතු ආදායම්— | | | | | | |
| ඒ.—(1) දේපල බදු ගිණුම | 56,476 | 19 | | | | |
| රජයේ ඉඩම් ... | 6,342 | 96 | | | | |
| ඒ.—(15) වරෙන්තු ගාස්තු ගිණුම ... | 6,102 | 77 | | | | |
| ඩී.—(1) නිවාස කුලී ගිණුම | 1,807 | 40 | | | | |
| ඊ.—(5) (ඒ) ජලබදු ගිණුම | 25,887 | 95 | | | | |
| ඊ.—(5) (බී) ජල සැපයීමේ සේවා ගාස්තු ගිණුම ... | 5,015 | 0 | | | | |
| ඊ.—(7) (බී) කඩ හා වෙළඳ මැසි කුලී ගිණුම ... | 2,210 | 45 | — | | 1,03,842 | 72 |
| ඊආර්.—(1) විදුලිබල ගාස්තු ගිණුම ... | — | | 45,475 | 1 | 45,475 | 1 |
| මුදල් ශේෂය ... | 34,825 | 40 | 94,840 | 27 | 1,29,665 | 67 |
| | 13,19,162 | 11 | 3,13,324 | 91 | 16,32,487 | 2 |

**1 වැනි සටහන.**—ඉහත සඳහන් ප්‍රාග්ධන වත්කම්වලට අමතරව මීට යාකර ඇති 1 වැනි උපලේඛනයේ සඳහන් නිශ්චල දේපල 1972.12.31 දිනට සභාව සතුව තිබේ.

කුලියාපිටිය නගරයේ විශේෂ කොමසාරිස් කේ. බී. සත්කුමාර වන මම, ඉහත සඳහන් වාර්තාව මාගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1972 දෙසැම්බර් 31 වැනි දිනට කුලියාපිටිය නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත්, වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

කේ. බී. සත්කුමාර,
විශේෂ කොමසාරිස්, කුලියාපිටිය නගරය.

1973 ජූලි මස 10 වෙනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඇස්. සුගතපාල,
සමාදාන විනිශ්චයකාර තැන.

1973 ජූලි මස 10 වෙනි දින,
කුලියාපිටිය විශේෂ කොමසාරිස් කාර්‍යාලයේදීය.

## 1 වැනි උපලේඛනය

### නගරසභා නිශ්චල දේපල ලැයිස්තුව

| අංකය | ඉඩමේ/ගොඩනැගිල්ලේ නම | පිහිටීම | ඉඩමේ ප්‍රමාණය අ. රූ. ප. | ගොඩනැගිලිවල බිම් ප්‍රමාණය ව. අ. | ඉඩමේ සහ ගොඩනැගිලිවල මුළු වටිනාකම රු. ශ. | වෙනත් දේ |
|---|---|---|---|---|---|---|
| 1 | නගරසභා කාර්යාල ගොඩනැගිල්ල | මාදම්පෙ පාර | — | 2,820 | 60,000 0... | වටිනාකම සාමාන්‍යයෙන් |
| 2 | ප්‍රජාමණ්ඩල ගොඩනැගිල්ල | නගරය | අංක 41 යටතේ ඉඩම් ප්‍රමාණය දක්වා අත | 750 | 15,000 0... | එම |
| 3 | ළමා සායන ගොඩනැගිල්ල | නගරය | | 740 | 7,400 0... | එම |
| 4 | නව නගර ශාලාව | නගරය | | 6,930 | 1,58,000 0... | ගොඩනැගූ වර්ෂය 1967 |
| 5 | පුස්තකාල ගොඩනැගිල්ල | නගරය | | 5,880 | 1,26,975 0... | ගොඩනැගූ වර්ෂය 1970 |
| 6 | ඔරලෝසු කණුව | නගරය | | 441 | 75,315 0... | වටිනාකම සාමාන්‍යයෙන් |
| 7 | නගරශාලා තාප්පය | නගරය | | දිග අඩි 500 × 3′ | 15,000 0... | — |
| 8 | සොහොන්පිටියේ ශාලාව | පල්ලපිටිය | — | 222 | 2,220 0... | — |
| 9 | තානායම සහ එම ඉඩම | මීගහකොටුව | 1 1 0 | 9,877 | 2,25,000 0... | වටිනාකම සාමාන්‍යයෙන් |
| 10 | පොදු වෙළඳපොල ගොඩනැගිල්ල | එම | — | 696 | 6,960 0... | — |
| 11 | මස් මඩුව | වීරඹුව | — | 650 | 6,500 0... | — |
| 12 | ගරාජය | එම | — | 1,004 | 10,040 0... | — |
| 13 | ගව මඩුව | එම | — | 287 | 2,870 0... | — |
| 14 | පොදු වෙළඳපොල ගොඩනැගිල්ල | නගරය | — | 8,695 | 1,60,865 0... | ගිණුම්වලට ඇතුලත්කර ඇත |
| 15 | බ්‍රහස්පතින්ද වෙළඳපොල සහ ඉඩම | පල්ලපිටිය | 2 0 6 | — | 1,30,260 0... | එම |
| 16 | ජල සම්පාදන යෝජනා ක්‍රමය<br>ජල ටැංකිය (1)<br>ජල ටැංකිය (2) | උඩුබද්දව<br>මීගහකොටුව<br>හෙට්ටිපොල පාර | — | — | 36,75,000 0... | ගිණුම්වලට ඇතුලත්කර ඇත |
| 17 | නිවාස යෝජනා ක්‍රමය | කනදූල්ල | — | නිවාස 24 යි | 60,000 0... | — |
| 18 | නිවාස යෝජනා ක්‍රමය | පල්ලපිටිය | — | නිවාස 50 යි | 1,62,000 0... | — |
| 19 | කදුරුගස්හේන නිවාස | කදුරුගස්හේන | 1 0 0 | නිවාස 10 යි | 30,465 0... | — |
| 20 | කම්කරු නිවාස | වීරඹුව | 2 0 0 | නිවාස 12 යි | 35,000 0... | — |
| 21 | පාතිමා මාවතේ පිහිටි ඉඩම සහ වැසිකිලිය | කොට්ඨාශ අංක 4 | 0 0 14.2 | — | 2,800 0... | පැවරුම් නියෝග එල්. ඒ. 7033/18.11.49 |
| 22 | කන්කානියාගාර වත්ත වැසිකිලිය ඇතුලුව | එම | 0 0 9.5 | — | 1,800 0... | පැවරුම් නියෝග එල්. ඒ. 391881/13.06.1930 |
| 23 | පල්ලපිටියේ සොහොන් පිටිය | කොට්ඨාශ අංක 6 | 1 3 2 | — | 12,000 0... | පැවරුම් නියෝග එල්. ඒ. වී 479/10.11.1949 |
| 24 | වෙහෙර ගොඩැල්ල මූකලාන ඉඩම | කොට්ඨාශ අංක 1 | 2 2 2 | අංක 17 සඳහන් නිවාස | 10,000 0... | පැවරුම් නියෝග එල්. ඒ. 939/26.05.1954 |
| 25 | ආයුර්වේද බෙහෙත්ශාලා ගොඩනැගිල්ල | මාදම්පෙ පාර | — | 960 | 19,200 0... | — |
| 26 | ගබඩා ගොඩනැගිල්ල හා විදුලි කාර්මික කාමරය | මාදම්පෙ පාර | — | 2,610 | 39,000 0... | — |
| 27 | ගබඩා ගොඩනැගිල්ල හා ඉඩම | මාදම්පෙ පාර | 0 0 33 | — | 6,600 0... | රජයෙන් ලබාගත් බදු ඉඩම 6068/30.03.39 |
| 28 | මස් මරණ මඩුව හා ළිඳ පිහිටි ඉඩම | කනදූල්ල | 0 2 5 | — | 6,000 0... | පැ.නි. වී 1042/07.08.1954 |
| 29 | අස්සැද්දුම හිස් ඉඩම | අස්සැද්දුම | 0 0 1 | — | 100 0... | පැ.නි. වී 1510/30.12.1956 |
| 30 | කනදූල්ල ඉඩම | කනදූල්ල | 0 0 29 | — | 3,000 0... | පැ.නි. වී 1767/19.06.1958 |
| 31 | විජයමාවත නාන ළිඳ | පල්ලපිටිය | — | 26′ × 25′ | 2,000 0... | ඔප්පු අංක 28814/07.02.59 |
| 32 | පල්ලපිටිය ළිඳ ... | එම | — | — | 2,000 0... | පැනි. 29427/30.12.59 |
| 33 | කහටගහමුල හේන ඉඩම | කොට්ඨාශ අංක 4 | 0 1 0.5 | — | 8,000 0... | පැ නි. 393/30.01.1964 |
| 34 | කහටගහමුල හේන ඉඩම | එම | 0 0 31 | — | 6,200 0... | පැ.නි. 394/30.01.1964 |
| 35 | තිඹිරිගහමුල හේන ඉඩම | එම අංක 5 | 0 0 6.75 | — | 800 0... | පැ.නි. 29921/19.09.57 |
| 36 | නුගවෙල ගාව හේන | එම | 1 3 27 | වෙළඳපොල පිහිටි ඉඩම | 15,000 0... | පැ.නි. 355/553/28.08.64 |
| 37 | නුගහගමුල වත්ත | නගරය | 0 0 4.85 | දණ්ඩගමුව ඔය හරහා යන පාර | 600 0... | පැ.නි. 29876/20.02.1969 |
| 38 | නුගගහමුල වත්ත | එම | 0 0 4.85 | එම | 600 0... | පැ.නි. 29877/26.02.1969 |
| 39 | නුගගහමුල වත්ත | එම | 0 0 1.65 | එම | 300 0... | පැ.නි. 5125/15.07.1969 |
| 40 | බණ්ඩාරනායක ක්‍රීඩාංගනය | එම | 2 1 7.5 | අංක 2 සිට 7 දක්වා ගොඩනැගිලි | 50,000 0... | පැ.නි. 109/එප්ට්පී 992 |
| 41 | සුසාන භූමිය ... | වීරඹුව | 6 0 10 | — | 12,000 0... | පැවරීම |
| 42 | කනදූල්ල ක්‍රීඩා පිටිය | කනදූල්ල | 7 0 0 | — | 15,000 0... | එම |
| 43 | පල්ලපිටිය මං සන්දිය ළිඳ | පල්ලපිටිය | — | 20′ × 25′ | 1,500 0... | සාමාන්‍ය වටිනාකම |
| 44 | අස්සැද්දුම ළිඳ | කුරුණෑගල පාර | — | 20′ × 25′ | 1,500 0... | එම |
| 45 | දණ්ඩගමුව ළිඳ | පනසල පාර මං සන්දිය | — | 20′ × 25′ | 2,000 0... | එම |

| අංකය | ඉඩමේ/ගොඩනැගිල්ලේ නම | පිහිටීම | ඉඩමේ ප්‍රමාණය අ. රූ. ප. | ගොඩනැගිලිවල බිම් ප්‍රමාණය ව. අ. | ඉඩමේ සහ ගොඩනැගිලිවල මුළු වටිනාකම රු. ශ. | වෙනත් දේ |
|---|---|---|---|---|---|---|
| 46 | ... මීගහකොටුව ළිඳ | ... මීගහකොටුව හං සන්දිය | — | ... 20′ × 25′ | ... 2,500 0... | සාමාන්‍ය වටිනාකම |
| 47 | ... කදුරුගස්හේන ලිඳ | ... කදුරුගස්හේන පාර ගම | — | ... 20′ × 25′ | ... 2,000 0... | එම |
| 48 | ... කදුරුගස්හේන ළිඳ | ... මාදම්පේ පාර ... | — | ... 20′ × 25′ | ... 2,000 0... | එම |
| 49 | ... කාර්යාලය ඉදිරිපිට ළිඳ | ... එම ... | — | ... 20′ × 25′ | ... 2,000 0... | එම |
| | | | | | 5,191,370 0 | |

1973 ජූලි මස 10 වෙනි දින,
කුලියාපිටිය, විශේෂ කොමසාරිස් කාර්යාලයේදී ය.

කේ. බී. සත්කුමාර,
විශේෂ කොමසාරිස්,
විශේෂ කොමසාරිස් කාර්යාලය,
කුලියාපිටිය.

7–978—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### කටුනායක පළාත් ආණ්ඩු සභාව

**1972 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන්වූ වර්ෂයේ ආදායම් සහ වියදම් ගිණුම (සාමාන්‍ය අංශය)**

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... ... | 47,008 5 | ඒ.—සාමාන්‍ය ආදායම ... ... ... | 93,710 43 |
| බී.—මංමාවත් ... ... ... | 8,654 58 | බී.—මංමාවත් ... ... ... | 799 47 |
| ඩී.—පළාත් ආණ්ඩු සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 4,350 99 | ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... ... | 4,652 50 |
| ඊ.—මහජන සෞඛ්‍ය ... ... ... | 85,453 5 | ඊ.—මහජන සෞඛ්‍යය ... ... ... | 50,013 31 |
| ඇම්.—කියවීම් ශාලා සහ පුස්තකාල ... ... | 6,841 90 | ඒජී.—මහජන ක්‍රීඩා ... ... | 47 92 |
| | | ඌණතාවය ... ... ... | 3,084 94 |
| | 1,52,308 57 | | 1,52,308 57 |

### කටුනායක පළාත් ආණ්ඩු සභාව

**1972 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන්වූ වර්ෂයේ ආදායම් සහ වියදම් ගිණුම (විදුලි අංශය)**

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| ජේ.—(1) විදුලි බල නිෂ්පාදනය ... ... | 81,018 8 | ජේ.—(1) විදුලිබලය විකිණීම ... ... | 1,30,741 94 |
| ජේ.—(2) අළුත්වැඩියා කිරීම් හා නඩත්තුව ... | 2,428 95 | ජේ.—(2) මීටර් බදු කුලී ... ... | 7,589 0 |
| ජේ.—(3) කම්බිවලට සහ නිවෙස්වලට යාකිරීමේ සේවාවන් | 5,200 0 | ජේ.—(3) මිළයට ගන්නන්ට කරදෙන වැඩ ... | 2,345 60 |
| ජේ.—(4) පාලනය සහ සාමාන්‍ය වියදම් ... | 57,941 78 | ජේ.—(4) මිශ්‍ර ආදායම් ... ... ... | 715 08 |
| ජේ.—(5) ණය ගෙවීම ... ... | 17,433 5 | ජේ.—(6) ජීවනාධාර මුදල් ගෙවීම සඳහා රජයේ ආධාර ... | 18,257 80 |
| | | ඌණතාවය ... ... ... | 4,372 44 |
| | 1,64,021 86 | | 1,64,021 86 |

කටුනායක නගර සභාවේ සභාපති ජෝර්ජ් ගුණසේකර වන මම, මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට ඉහත දැක්වෙන ආදායම් සහ වියදම් ගිණුම 1972.12.31 දිනට කටුනායක නගර සභාවේ ආදායම් සහ වියදම් පිළිබඳ සත්‍යවූත් නිවැරදිවූත් වාර්තාවක් බව මෙයින් සහතික කරමි.

ජෝර්ජ් ගුණසේකර,
සභාපති,
නගර සභාව, කටුනායක.

නගර සභා කාර්යාලය,
කටුනායක, 1973.07.06 දින.

නිවැරදි බවට සහතික කරමි.

කේ. ඩී. අබේසේකර,
නගර සභික.

1973.07.06 දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඇස්. පී. එෆ්. වෛද්‍යසේකර,
සාමදාන විනිශ්චයකාර.

7–898—73.07.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

### කලවාකැලේ ලිඳුල පළාත් ආණ්ඩු සභාව

### 1972 12.31 දිනෙන් අවසන්වූ වර්ෂයේ විදුලිය අංශයේ ආදයම් හා වියදම් ගිණුම

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ජේ.—(1) විදුලි බලය මිළට ගැනීමේ වියදම් ... | 74,888 | 55 | ජේ.—(1) (ඒ) විදුලි බලය විකිණීමෙන් ආදයම ... | 1,10,511 | 15 |
| ජේ.—(2) අළුත්වැඩියා හා නඩත්තු වියදම් ... | 8,218 | 55 | ජේ.—(1) (බී) වීථි ආලෝක ආදයම ... ... | 15,195 | 65 |
| ජේ.—(3) සේවා සහ නිවාස පිරිද්දුම් වියදම් ... | 2,508 | 16 | ජේ.—(2) මීටර් බදු ආදයම ... ... | 5,275 | 0 |
| ජේ.—(4) පරිපාලන හා සාමාන්‍ය වියදම් ... | 31,294 | 74 | ජේ.—(3) පාරිභෝගික වැඩ ආදයම ... ... | 872 | 88 |
| ජේ.—(5) ණය ගෙවීම ... ... | 1,579 | 87 | ජේ.—(4) මිශ්‍ර ආදයම් ... ... ... | 603 | 89 |
| ජේ.—(6) දීර්ඝ කිරීම් හා වැඩිදියුණු කිරීම් වියදම් ... | 1,110 | 86 | ජේ.—(5) වැඩිපුර ගෙවීම් ආපසු ලැබීම ... ... | 54 | 07 |
| වර්ෂයේ අතිරික්තය ... ... | 22,823 | 91 | ජේ.—(6) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... | 7,512 | 0 |
| | | | ජේ.—(7) අකුරු දීමනා ... ... | 2,400 | 0 |
| | 1,42,424 | 64 | | 1,42,424 | 64 |

තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාවේ සභාපති එඩ්මන්ඩ් වනිගසේකර වන මම, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට නගර සභා ආඥපනතේ (පරිච්ඡෙද 255) ප්‍රකාර 1972 වර්ෂයේ කලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාවේ ආදයම් හා වියදම් (විදුලි අංශය) පිළිබඳ නිවැරදි හා සත්‍ය වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

එඩ්මන්ඩ් වණිගසේකර'
සභාපති.

යූ. එල්. එම්. සහාබදීන්,
ලේකම්.

1973 ජූලි මස 09 වැනි දින,
තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

ඉහත සඳහන් ප්‍රකාශනය නිවැරදි බවට සහතික කරමි.

එච්. පී. විජේසිරි,
අංක 6 දරණ කොට්ඨාශයේ නියෝජිත

1973 ජූලි මස 09 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඩී. කේ. ගුණසේකර,
සමාදාන විනිශ්චයකාර තැන

### තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාවේ 1972.12.31 දිනෙන් අවසන්වූ වර්ෂයේ සාමාන්‍ය අංශයේ ආදයම් හා වියදම් ගිණුම

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් ... ... ... | 94,949 | 68 | ඒ.—සාමාන්‍ය ආදයම් ... ... ... | 1,84,937 | 47 |
| බී.—මංමාවත් වියදම් ... ... ... | 26,228 | 12 | බී.—මංමාවත් වියදම් ... ... ... | 2,355 | 04 |
| සී.—තානායම් හා අම්බලම් වියදම් ... ... | 31,652 | 95 | සී.—තානායම් හා අම්බලම් ආදයම් ... ... | 13,474 | 70 |
| ඩී.—ඉඩම් හා ගොඩනැගිලි වියදම් ... ... | 65,510 | 93 | ඩී.—ඉඩම් හා ගොඩනැගිලි ආදයම් ... ... | 30,526 | 95 |
| ඊ.—මහජන සෞඛ්‍ය වියදම් ... ... | 1,79,015 | 20 | ඊ.—මහජන සෞඛ්‍ය ආදයම් ... ... | 46,626 | 13 |
| එෆ්.—මහජන විනෝදය වියදම් ... ... | 1,555 | 75 | එෆ්.—මහජන විනෝදය ආදයම් ... ... | 26,613 | 10 |
| | | | ජී.—සුසානභූමි ආදයම් ... ... ... | 29 | 0 |
| | | | එච්.—සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු ... | 46 | 50 |
| | | | වර්ෂයේ ඌනතාවය ... ... | 94,303 | 74 |
| | 3,98,912 | 63 | | 3,98,912 | 63 |

තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාවේ සභාපති, එඩ්මන්ඩ් වණිගසේකර වන මම, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට නගර සභා ආඥාපනතේ (පරිච්ඡෙද 255) ප්‍රකාර 1972 වර්ෂයේ තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාවේ ආදයම් හා වියදම් (සාමාන්‍ය අංශය) පිළිබඳ නිවැරදි හා සත්‍ය වාර්තාව බක්වට මෙයින් සහතික කරමි.

එඩ්මන්ඩ් වණිගසේකර'
සභාපති.

යූ. එල්. එම්. සහාබදීන්,
ලේකම්.

1973 ජූලි මස 09 වැනි දින,
තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

1973 ජූලි මස 09 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඩී. කේ. ගුණසේකර,
සමාදාන විනිශ්චයකාර තැන.

ඉහත සඳහන් ප්‍රකාශනය නිවැරදි බවට සහතික කරමි.

එච්. පී. විජේසිරි,
අංක 6 දරණ කොට්ඨාශයේ නියෝජිත.

## තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාවේ දෙසැම්බර් 31 දිනට වූ ශේෂ පත්‍රය

| 71.12.31 දිනට රු. ශ. | | සාමාන්‍ය රු. ශ. | විදුලිය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|---|---|
| | **සංචිතය** | | | |
| 84,723 20 | ප්‍රාග්ධන ... ... ... | 88,230 35 | 6,492 85 | 94,723 20 |
| 23,000 0 | ක්ෂය සංචිතය ... ... ... | | 23,000 0 | 23,700 0 |
| | **දීර්ඝ කාලීන ණය** | | | |
| 5,43,251 0 | දේශීය ණය හා සංවර්ධන අරමුදල | 5,04,594 60 | 1,575 20 | 5,06,169 80 |
| | **තැන්පත්** | | | |
| 71,449 76 | තැන්පත් : ... ... ... | 46,177 42 | 41,625 18 | 87,802 60 |
| | **වැය නොවූ ණය** | | | |
| 4,73,092 67 | ණය ... ... | 4,72,757 83 | — | 4,72,757 83 |
| 25,115 88 | රජයේ ආධාර ... ... | 769 52 | — | 769 52 |
| | | | | 6,635 82 |
| | **ජංගම බැරකම්** ... ... | — | | 1,939 46 |
| 23,847 85 | ණය හිමියෝ ... ... | 79,198 47 | 20,992 90 | 1,00,191 37 |
| | **උපචිත වියදම්** | | | |
| | වැටුප් හා වේතන ... ... | 597 44 | 113 20 | 710 64 |
| | වියදම් ... ... | 366 15 | — | 366 15 |
| 1,38,945 27 | අතිරික්ත හා ඌනතා ගිණුම (සාමාන්‍ය) ... | — | — | — |
| | 31.12.72 දිනට 1,39,477 82 ... | — | — | — |
| | වර්ෂයේ ඌනතාවය අඩුකළා :— 94,303 74 | 45,174 8 | — | 45,174 8 |
| | අතිරික්ත හා ඌනතා ගිනුම (විදුලිය) වර්ෂයේ | | | |
| | අතිරික්තය 22,823 91 අඩුකළා :— 31.12.72 | | | |
| | ඌන. ... 7,959 71 | — | 14,864 20 | 14,864 20 |
| 13,93,425 63 | | 12,37,865 86 | 1,08,663 53 | 13,46,529 39 |

| 31.12.72 දිනට රු. ශ. | | සාමාන්‍ය රු. ශ. | විදුලිය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|---|---|
| 5,43,251 0 | ණය යෝජනා ක්‍රම ... | 5,04,594 60 | 1,575 20 | 5,06,169 80 |
| 70,023 20 | ද්‍රව භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 78,374 65 | 7,186 35 | 85,561 0 |
| 24,700 0 | රථ වාහන ... ... | 24,700 0 | — | 24,700 0 |
| 2,000 0 | **ස්ථාවර තැන්පත් හා ඉතිරි කිරීම් :** | | | |
| | මහජන බැංකුව—තලවාකැලේ ... | 20,000 0 | — | 20,000 0 |
| 70 0 | දුරකථන පෝස්ට් මාස්ටර් ජනරාල් | 270 0 | — | 270 0 |
| | **ජංගම වත් කම් :** | | | |
| 20,000 0 | ක්‍රීඩා භූමියට ඉඩම් අත්කර ගැනීම | — | — | — |
| 26,090 69 | අත්තිකාරම් ... ... | 24,507 6 | 3,100 26 | 27,607 32 |
| 4,69,230 60 | ජලසම්පාදන යෝජනා ක්‍රම සඳහා ජ. ස. හා ජ. ප්‍ර. අධ්‍යක්ෂකට අත්තිකාරම් ... | 4,69,230 60 | — | 4,69,230 60 |
| 35,818 24 | ගබඩා අත්තිකාරම් ගිණුම ... | 17,561 81 | 29,923 79 | 47,485 60 |
| 87,895 32 | ණය ගැතියෝ ... ... | 24,799 74 | 13,664 4 | 38,463 78 |
| 20,645 56 | දේපල බදු එකතු කිරීමේ ගිණුම ... | 25,427 66 | — | 25,427 66 |
| 6,635 82 | ජලබදු එකතු කිරීමේ ගිණුම ... | 9,957 98 | — | 9,957 98 |
| 1,939 46 | ජ. සේ. හා මීටර් බදු ගිණුම ... | 3,482 46 | — | 3,482 46 |
| 1,808 98 | වරෙන්තු ගාස්තු එකතු ගිණුම ... | 2,078 64 | — | 2,078 64 |
| 18,190 62 | කුලී එකතු කිරීමේ ගිණුම ... | 26,255 90 | — | 26,255 90 |
| 12 0 | කසළ ශෝධන ගාස්තු එකතු කිරීමේ ගිණුම | 14 0 | — | 14 0 |
| 480 0 | අමදිමේ ගාස්තු ගිණුම ... | 840 0 | — | 840 0 |
| 33,366 20 | විදුලි ගාස්තු එකතු කිරීමේ ගිණුම... | — | 38,929 70 | 38,929 70 |
| 5,882 96 | මුදල් එකතු කිරීමේ ගිණුම ... | 5 770 76 | 14,284 19 | 20,054 95 |
| 7,384 98 | ඌනතාවය (විදුලිය) ... | — | — | — |
| 13,93,425 63 | | 12,37,865 86 | 1,08,663 53 | 13,46,529 39 |

තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාවේ සභාපති එඩ්මන්ඩ් වනිගසේකර වන මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සහ මෙම සභාවේ පොත් පත් වලින් පෙන්වන පරිදි ඉහත සඳහන් ශේෂ පත්‍රයෙන් මෙම සභාවේ 1972 දෙසැම්බර් 31 දිනට වූ සත්‍ය හා සාධාරණ තත්ව විස්තරයක් පෙන්නුම් කරන බව මෙයින් ස්ථිරව හා සත්‍යයෙන් ප්‍රකාශ කරමි.

යූ. එල්. එම්. සහාබ්දීන්,
ලේකම්.

එඩ්මන්ඩ් වනිගසේකර,
සභාපති.

07.07.1973.
තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දී.

1973 ජූලි මස 07 දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඩී. කේ. ගුණසේකර,
සාමදාන විනිශ්චය කාර තැන.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

එච්. ජී. විජේසිරි,
අංක 6 දරණ කොට්ඨාශයේ නියෝජිත.

තලවාකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාවේ 1972 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂයේ ශේෂ පිරික්සුම

| | 01.01.72 දිනට හර රු. ශ. | 01.01.72 දිනට බැර රු. ශ. | වර්ෂයේ එකතුව හර රු. ශ. | වර්ෂයේ එකතුව බැර රු. ශ. | 31.12.72 දිනට හර රු. ශ. | 31.12.72 දිනට බැර රු. ශ. |
|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය —සාමාන්‍ය | — | 88,230 35 | — | — | — | 88,230 35 |
| —විදුලිය | — | 6,492 35 | — | — | — | 6,492 85 |
| ක්ෂය සංචිතය—විදුලිය | — | 23,000 0 | — | — | — | 23,000 0 |
| දේශීය ණය හා සංවර්ධන අරමුදල (දීර්ඝ කාලීන) —සාමාන්‍ය | — | 5,40,271 30 | 35,676 70 | — | — | 5,04,594 60 |
| —විදුලිය | — | 2,979 70 | 1,404 50 | — | — | 1,575 20 |
| තැන්පත් ගිණුම—සාමාන්‍ය | — | 37,696 87 | 26,486 43 | 34,966 98 | — | 46,177 42 |
| —විදුලිය | — | 33,752 89 | 5,109 57 | 12,981 86 | — | 41,625 18 |
| රජයේ ආධාර | — | 25,115 88 | 63,555 36 | 38,209 0 | — | 769 52 |
| වැය නොවූ ණය මුදල් —සාමාන්‍ය | — | 4,73,092 67 | 334 84 | — | — | 4,72,757 83 |
| ණය හිමියෝ—සාමාන්‍ය | — | 11,210 98 | 18,705 95 | 86,693 44 | — | 79,198 47 |
| —විදුලිය | — | 12,636 87 | 72,925 98 | 81,282 1 | — | 20,992 90 |
| ගෙවිය යුතු වැටුප් හා වේතන—සාමාන්‍ය | — | — | — | 597 44 | — | 597 44 |
| —විදුලිය | — | — | — | 113 20 | — | 113 20 |
| ගෙවිය යුතු වියදම් ගිණුම —සාමාන්‍ය | — | — | — | 366 15 | — | 366 15 |
| අතිරික්ත හා ඌනතා ගිණුම්—සාමාන්‍ය | — | 1,38,945 27 | 3,795 80 | 4,328 35 | — | 1,39,477 82 |
| —විදුලිය | 7,384 98 | — | 1,897 90 | 1,323 17 | 7,959 71 | — |
| ණය යෝජනා ක්‍රම —සාමාන්‍ය | 5,40,271 30 | — | — | 35,676 70 | 5,04,594 60 | — |
| —විදුලිය | 2,979 70 | — | — | 1,404 50 | 1,575 20 | — |
| දව භාණ්ඩ හා කාර් උපකරණ සාමාන්‍ය උපකරණ —සාමාන්‍ය | 63,530 35 | — | 14,844 30 | — | 78,374 65 | — |
| —විදුලිය | 6,492 75 | — | 693 50 | — | 7,186 35 | — |
| රථවාහන | 24,700 0 | — | — | — | 24,700 0 | — |
| ස්ථාවර තැන්පත්—තලවාකැලේ මහජන බැංකුව | 20,000 0 | — | — | — | 20,000 0 | — |
| දුර කථන තැන්පත්—පෝස්ට් මාස්ටර් ජනරාල් | 70 0 | — | 200 0 | — | 270 0 | — |
| අත්තිකාරම් ගිණුම—සාමාන්‍ය | 22,532 47 | — | 22,955 64 | 20,981 5 | 24,507 6 | — |
| ජල සම්පාදන හා ජල ප්‍රවාහන අධ්‍යක්ෂකට ජල යෝජනා ක්‍රමය සඳහා | 4,69,230 60 | — | — | — | 4,69,230 60 | — |
| ජේ. ඇම්. රාසික්—රජ්ජම්මන—මඩවලඋප්පත | එළු හා හරක් මස් ... | රජ්ජම්මන |

7—997—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## පුස්සැල්ලාව නගරය

ගෝඝාතක ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති අය එහි සඳහන් වන ස්ථානයේ 1973 වර්ෂයට මස්පිණිස සතුන් මරා මස් විකිණීම් වස්, බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම් පතක් ඉදිරිපත් කොට ඇති බව 272 වැනි අධිකාරය වන ගෝඝාතක ආඥාපනතේ 7(2) වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි. මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන පුස්සැල්ලාව නගර සීමා ප්‍රදේශය තුළ පදිංචි යමෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වන කරුණු පිටපත් දෙකකින් යුතු ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බව මෙයින් දන්වමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඒ. සී. එම්. සහිදු ... | ගවමස් ... | අංක 7 දරණ කඩකාමරය, ප්‍රසිද්ධ වෙළඳ පොළ, පුස්සැල්ලාව. |

1973.07.02 වැනි දින,
විශේෂ කොමසාරිස් කාර්‍යාලය,
පුස්සැල්ලාව

එල්. ජී. ඩී. පෙරේරා,
විශේෂ කොමසාරිස් පුස්සැල්ලාව නගරය.

7-886—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## වැලිගම නගර සභාව

විවෘත කිරීමක්

වැලිගම නගරයමේ නව දෙමහල් ගොඩනැගිල්ල රාජ්‍ය පරිපාලන, පළාත් පාලන, ස්වදේශ කටයුතු හා අධිකරණ කටයුතු පිළිබඳ ගරු ඇමති පිලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක මැතිතුමා අතින් 1973 අගෝස්තු මස 11 දින උත්සවශ්‍රීයෙන් විවෘත වන බැවින් එදිනට නානායම විවෘතව තබනුයේ ආරාධිත අමුත්තන්ට පමණක් බව කාරුණාවෙන් දන්වමි.

සභාපති,
වැලිගම නගර සභාව.

1973.7.16 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

7-1061—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

## පොල්ගහවෙල සුළු නගර සභාව

1973 වර්ෂයේ පළමුවැනි හා දෙවැනි කාර්තුව සඳහා තක්සේරු බද්ද

මෙම නගර සභාවේ 1973 වර්ෂය වෙනුවෙන් ප්‍රතිශෝධිත තක්සේරු බදු ලේඛන සකස් කිරීමේදී ඇතිවූ නොවැලැක්විය හැකි ප්‍රමාදය හේතු කොට ගෙන 1973 වර්ෂයේ පළමුවැනි හා දෙවැනි කාර්තු වෙනුවෙන් තක්සේරු බදු අයකිරීමට කල් මදි විය. එබැවින්, මෙම නගර සභාවේ අංක 3 හා 73.06.28 දනම දරණ සභා සම්මුතිය අනුව 1973 වර්ෂයේ පළමුවැනි හා දෙවැනි කාර්තු සඳහා වරෙන්තු ගාස්තු නොමැතිව 1973.08.31 දින දක්වා තක්සේරු බදු ගෙවිය හැකි බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ගාමිණී ද සිල්වා,
සභාපති,
පොල්ගහවෙල සුළු නගර සභාව.

1973 ජූලි මස 13 දින.

7-984—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

### බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව

ඝෝෂාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් 1973 වර්ෂයට ඒ ඒ නම් ඉදිරියෙහි සඳහන් කොට ඇති ස්ථානයන්හි මස් කඩ පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, ඝෝෂාතක ආඥාපනතේ (272 වන අධිකාරිය) 7 (2) වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. එස්. එම්. ස්මයිල්, 1134, වැලිකඩ, රාජගිරිය ... | පැලවත්ත ගව මස් කඩය. |
| 2. ඇල්. ඒ. විල්බට්, 1134, වැලිකඩ, රාජගිරිය ... | කොස්වත්ත ගව මස් කඩය. |

ඕ. පී. විජේසිංහ,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

1973 ජූලි මස 12 වැනි දා,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභා
කාර්යාලයේ දී.

7–932—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### බණ්ඩාරවෙල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලය

ඝෝෂාතක ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම සඳහන් අය එහි සඳහන් ස්ථානයෙහි 1973 වර්ෂයේ මස් වෙළඳාම කරගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ඝෝෂාතක ආඥාපනතේ (272 වන පරිච්ඡෙදයේ) 7 (2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන බණ්ඩාරවෙල නගරසීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධවන්නේ කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට්පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| අයිෂා බීබී මිය., අංක 4, පූනාගල පාර නිවාස යෝජනා ක්‍රමය, බණ්ඩාරවෙල | එළුමස් ... | බණ්ඩාරවෙල පොදු වෙළඳ සැලේ අංක 21 දරණ කඩ බක්කිය |

ආර්. සැන්ට්. ඇස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්, බණ්ඩාරවෙල නගරය

බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය,
1973 ජූලි මස 11 දින.

7–890—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### බේරුවල් අලුත්ගම් මාලෙවන් බද්දු ගම්සභාව—කළුතර දිස්ත්‍රික්කය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයේ 1973 වර්ෂය සඳහා මස් කඩ පවත්වාගෙන යැමට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කලුතර දිස්ත්‍රික්කයේ බේරුවල් අලුත්ගම් මාලාවෙන් බද්දු ගම්සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්ත වන සේ සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරිය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම දෙමි.

උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | ඇම්. කේ. ඇස්. අබ්දුල් රහුමාන් නො. 92, පරන පාර බේරුවල | වරාපිටිය කුරුදුවත්ත නැමති ඉඩම | එළුහරක් මස් |
| 2. | ඇම්. අයි. ඇම්. ජිබ්රි, දර්ගා පාර, පාඩාගොඩ, බේරුවල | පිටවල මන්ඩාවලවත්ත නමැති ඉඩම | එළුහරස් මස් |

ඩී. ඒ. ආරියනන්ද,
සභාපති,
බේරුවල් අලුත්ගම් මාලෙවන් බද්දු ගම්සභාව.

1973 ක්වූ ජූලි මස 11 වෙනි දින,
ගම්සභා කායර්‍යාලය, පාඩාගොඩ.

7–856—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### හෝමාගම සුළු නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් විකිණීම සඳහා 1973.07.01 සිට 1973.12.31 දක්වා කාලය සඳහා බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන හෝමාගම සුළු නගර සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වන අධිකාරයේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

විල්ප්‍රඩ් සේනානායක,
හෝමාගම සුළු නගර සභාපති.

1973 ජූලි මස 6 වැනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලය යේදීය.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ආර්. එස්. අබ්දුල් කාදර් ... | එළ හරක් මස් | හෝමාගම මංසන්දියේ අලුත් වෙළඳ පොලේ අංක 1 දරණ කඩය |
| එන්. මොහමඩ් ... | එළ හරක් මස් | හෝමාගම මංසන්දියේ අලුත් වෙළඳ පොලේ අංක 2 දරණ කඩය |
| ඩී. ඇල්. ඩී. පෙරේරා ... | ඌරුමස් ... | හෝමාගම බදාදා/ඉරිදා පොල පැවැත්වෙන භූමියේ අංක 3 කඩය |

7–857—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

### 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත) (261 වැනි අධිකාරිය)

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ, 1963 ජූනි මස 21 දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 38 වැනි කාණ්ඩයද, පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ, 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණ ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා වූ කාණ්ඩද (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුළත්ව) මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට, මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව උඩගම්පහ ගම් සභාව විසින් ප්‍රාදේශික බල මණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ යෝජනා කර සිටිනු ලැබේ.

ඒ. ඇම්. අමරසිංහ,
සභාපති,
හා. ප. උඩගම්පහ ගම්සභාව.

හා. ප. උඩගම්පහ ගම්සභාව,
අලම්තුගොඩ,
1973 ජූලි මස 16 වැනි දින.

7-1075 —73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### කළුතර බද්ද ගම්සභා ප්‍රදේශය

#### ජලභීතිකා රෝගය

කළුතර බද්ද ගම්සභා ප්‍රදේශය තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් එම ප්‍රදේශය තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක් හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නාවූ යම්කිසි සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලෙහිම විනාශ කරනු ලබන බව (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වන වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය ගැසට් පත්‍රයේ පළවන දින සිට මාස හයක (6) කාලයක් බල පවත්වනවා ඇත.

සී. ලුවිස් සිල්වා,
සභාපති,
කළුතර බද්ද ගම්සභාව.

1973 ජූලි මස 13 වැනි දින,
බෝම්බුවල-නාගොඩ,
කළුතර-බද්ද ගම්සභා කාර්යාලයේ දී ය.

7-1060 —73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

### හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය ගම්සභාව

#### දියුණු ප්‍රදේශය ප්‍රකාශයට පත්කිරීම

පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය ගම්සභා ප්‍රදේශයට අයත් මෙහි පහත සඳහන් සීමා ප්‍රදේශයන් ගම්සභා ආඥාපනතේ 257 වන අධිකාරියේ 37 ඒ වගන්තිය යටතේ හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව දියුණු ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පමුණුවා ඇති බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම්දෙනු ලැබේ.

ආරියදාස රාජපක්ෂ,
වීරකැටිය ගම්සභාවේ සභාපති.

වීරකැටිය ගම්සභා කාර්යාලය,
වීරකැටිය,
73.07.09.

#### උපලේඛනය

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තු ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වීරකැටිය ගම්සභා ප්‍රදේශයේ මණ්ඩාඩුව, බුද්දියගම හා යක්ගස්මුල්ල යන ගම්වලින් යුක්තවූද පහත සඳහන් මායිම් වලින් යුත් සියලුම ඉඩම් ප්‍රදේශය :—

**උතුරට :** ගලහිටිය-පඹුරාව, මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ අංක 1/4 දරණ බෝක්කුවේ මධ්‍යයේ සිට එකී පාරේ මධ්‍ය රේඛාවට ලම්බකව උතුරු දෙසට අඳින ලද රේඛාවේ අඩි 200 ක් දුරින් පිහිටි ලක්ෂයක සිට එකී පාරේ මධ්‍ය රේඛාවට අඩි 200 ක් දුරින් හා සරල සමාන්තරව නැගෙනහිර දෙසට අඳින ලද රේඛාව වීරකැටිය-මිද්දෙනිය මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 200 ක් දුරින් හා බටහිරින් පිහිටි ලක්ෂයක් හමුවන තෙක්ද එතැන් සිට වීරකැටිය-මිද්දෙනිය මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 200 ක් දුරින් හා සරල සමාන්තරව උතුරු දෙසට අඳින ලද රේඛාව එකී පාරේ අංක 2/5 දරණ බෝක්කුවේ මධ්‍ය ලක්ෂයේ සිට එකී මධ්‍ය රේඛාවලට ලම්බකව බටහිර දෙසට අඳින ලද රේඛාව හමුවන තෙක්ද, එතැන් සිට එකී ලම්බක රේඛාව ඔස්සේ නැගෙනහිර දෙසට අඳින ලද රේඛාව වීරකැටිය-මිද්දෙනිය මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ අංක 2/5 බෝක්කුවේ මධ්‍ය හරහා අඩි 600 ක් දුරින් පිහිටි ලක්ෂයක් දක්වාද,

**නැගෙනහිරට :** අවසන් වරට සඳහන් ලක්ෂයේ සිට මිද්දෙනිය-වීරකැටිය මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 300 ක් දුරින් හා සරල සමාන්තරව දකුණු දෙසට අඳින ලද රේඛාව කොටබෝ-මණ්ඩාඩුව ගම්සභා පාරේ මධ්‍ය රේඛාවට අඩි 200 ක් උතුරින් පිහිටි ලක්ෂයක් හමුවන තෙක්ද, එතැන් සිට එකී ගම්සභා පාරේ මධ්‍ය රේඛාවට අඩි 200 ක් දුරින් හා සරල සමාන්තරව නැගෙනහිර දෙසට අඳින ලද රේඛාව එකී පාරේ 1/4 සැතපුම් කණුවේ මධ්‍යයේ සිට එකී පාරේ මධ්‍ය රේඛාවට ලම්බකව උතුරු දෙසට අඳින ලද රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එකී ලම්බක රේඛාව ඔස්සේ දකුණු දෙසට අඳින ලද රේඛාව එකී පාරේ 1/4 සැතපුම් කණුව හරහා අඩි 400 ක් දක්වා දුරින් පිහිටි ලක්ෂය දක්වාද, එතැන් සිට එකී පාරේ මධ්‍ය රේඛාවට අඩි 200 ක් දුරින් හා සරල සමාන්තරව බටහිර දෙසට අඳින ලද රේඛාව මිද්දෙනිය-වීරකැටිය මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 300 ක් දුරින් පිහිටි ලක්ෂයක් හමුවන තෙක්ද, එතැන් සිට මිද්දෙනිය-වීරකැටිය මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 300 ක් දුරින් හා සරල සමාන්තරව දකුණු දෙසට අඳින ලද රේඛාව වීරකැටිය-රන්න මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 300 ක් උතුරින් පිහිටි ලක්ෂයක් හමුවන තෙක්ද, එතැන් සිට වීරකැටිය-රන්න මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 300 ක් දුරින් හා සරල සමාන්තරව නැගෙනහිර දෙසට අඳින ලද රේඛාව එකී පාරේ අංක 9/3 බෝක්කුවේ මධ්‍යයේ සිට එකී පාරේ මධ්‍ය රේඛාවට ලම්බකව උතුරු දෙසට අඳින ලද රේඛාවේ අඩි 300 ක් දුරින් පිහිටි ලක්ෂයක් හමුවන තෙක්ද, එතැන් සිට එකී ලම්බක රේඛාව ඔස්සේ දකුණු දෙසට අඳින ලද රේඛාව එකී පාරේ අංක 9/3 බෝක්කුවේ මධ්‍යය හරහා අඩි 600 ක් දුරින් පිහිටි ලක්ෂයක් දක්වාද, එතැන් සිට රන්න-වීරකැටිය මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 300 ක් දුරින් හා සරල සමාන්තරව බස්නාහිර දෙසට අඳින ලද රේඛාව වීරකැටිය-තංගල්ල මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 300 ක් නැගෙනහිර දෙසින් පිහිටි ලක්ෂයක් හමුවන තෙක්ද, එතැන් සිට වීරකැටිය-තංගල්ල මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 300 ක් දුරින් හා සරල සමාන්තරව ඊශාන දෙසට අඳින ලද රේඛාව එකී පාරේ අංක 7/9 බෝක්කුවේ මධ්‍යයේ සිට එකී පාරේ මධ්‍ය රේඛාවට ලම්බකව නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවේ අඩි 300 ක් දුරින් පිහිටි ලක්ෂයක් හමුවන තෙක්ද,

**දකුණට :** අවසන් වරට සඳහන් ලක්ෂයේ සිට තංගල්ල-වීරකැටිය මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ අංක 7/9 දරණ බෝක්කුවේ මධ්‍ය ලක්ෂය හමුවනතෙක් බස්නාහිර දෙසට අඳින ලද රේඛාව අඩි 300 ක් දුරින් පිහිටි ලක්ෂයක් දක්වා බටහිර දෙසට දීර්ඝ කිරීමෙන්ද, එතැන් සිට තංගල්ල-වීරකැටිය මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට බස්නාහිරින් අඩි 300 ක් දුරින් හා සරල සමාන්තරව වයඹ දෙසට අඳින ලද රේඛාව වීරකැටිය-බෙලිඅත්ත මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට ඊශාන දෙසින් අඩි 300 ක් දුරින් පිහිටි ලක්ෂයක් හමුවන තෙක්ද, එතැන් සිට වීරකැටිය-බෙලිඅත්ත මහා මාර්ග දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාවට අඩි 300 ක් දුරින් හා සරල සමාන්තරව නිරිත දෙයට අඳින ලද රේඛාව එකී පාරේ අංක 6/4

ඒකකයක් ශත 14 බැගින් වූ ඒකක ගාස්තුවකින් ද මෙම දෙකොටස් ගාස්තු ක්‍රමය සමන්විත වන්නේ ය.

2. අවශ්‍යතා ගාස්තුව (මනු කුලියත් ඇතුළුවයි)

නිර්ණීත අවශ්‍යතාව කි. වෝ. ඇ. 20 ට නොවැඩි ස්ථාපන වෙනුවෙන් මසකට කි.වෝ.ඇ. එකකට හෝ ඉන් කොටසකට හෝ රු. 9 බැගින්. කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තු වනුයේ රු. 27 ක අඩුම ගාස්තුවකට යටත් වූ නිර්ණීත අවශ්‍යතා වේ කි.වෝ.ඇ. සංඛ්‍යාව අනුව ගණන් බැලූ ගාස්තුවකි.

3. උපරිම අවශ්‍යතා ගාස්තුව (මනු කුලියක් ඇතුළුවයි)

කි.වෝ.ඇ. 20 කට වැඩි ස්ථාපන වෙනුවෙන්.

උපරිම අවශ්‍යතාවේ මුල් කි.වෝ.ඇ. 25 හේ එක් එක් කි.වෝ.ඇ. වෙනුවෙන් කි.වෝ.ඇ. එකක් රු. 9 බැගින්.

උපරිම අවශ්‍යතාවේ කි.වෝ.ඇ. 25 ට වැඩි වූ කි.වෝ.ඇ. 50 ට නොවැඩි එක් එක් කි.වෝ.ඇ. වෙනුවෙන් කි.වෝ.ඇ. එකක් රු. 8.50 බැගින්.

උපරිම අවශ්‍යතාවේ කි.වෝ.ඇ. 50 ට වැඩි සෑම කි.වෝ.ඇ. එකක් වෙනුවෙන් කි.වෝ.ඇ. එකක් රු. 8 බැගින්.

4. කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 180 කි.

ගාස්තු අංක 6 (වාණිජ කටයුතු සඳහා)

1. මෙම ගාස්තු ක්‍රමය සාප්පුවල, කාර්යාලවල, බැංකුවල, ගුදම්වල, බලපත්‍ර ලත් හෝටල්වල, තේ පැන් ශාලාවල, පොදු ගොඩනැගිලිවල, රෝහල්වල, දුම්රිය පොලවල, අධ්‍යාපනික ආයතනවල හා වෙනත් එවැනි ස්ථානවල භාවිතා කෙරන විදුලි බලය සැපයීම වෙනුවෙන් අදාල වන්නේ ය.

මෙම සැපයුම මනුගත කොට දෙකොටස් ගාස්තු ක්‍රමයකට අනුව අය කෙරෙනු ඇත. අවශ්‍යතාවය හා උපරිම අවශ්‍යතාව වෙනුවෙන්, පහත සඳහන් උපලේඛනය අනුව පිළියෙල කල ගාස්තුවකින් ද, සියළුම කටයුතු සඳහා පරිහරණය කරන ලද ඒකක සඳහා ඒකකයක් ශත 14 බැගින් වූ ඒකක ගාස්තුවකින් ද මෙම දෙකොටස් ගාස්තු ක්‍රමය සමන්විත වන්නේ ය.

2. අවශ්‍ය ගාස්තුව (මනු කුලියත් ඇතුළුවයි.)

නිර්ණීත අවශ්‍යතාව කි.වෝ.ඇ. 20 කට නොවැඩි ස්ථාපන වෙනුවෙන් මසකට එක් එක් කි.වෝ.ඇ. එකකට හෝ ඉන් කොටසකට හෝ රු. 16 බැගින්.

කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 48ක අඩුම ගාස්තුවකට යටත් වූ නිර්ණීත අවශ්‍යතාවේ කි.වෝ.ඇ. ප්‍රමාණය අනුව ගණන් බැලූ ගාස්තුවකි.

3. උපරිම අවශ්‍යතා ගාස්තුව (මනු කුලියත් ඇතුළුවයි)

කි.වෝ.ඇ. 20 කට වැඩි ස්ථාපන වෙනුවෙන්.

උපරිම අවශ්‍යතාවේ මුල් කි.වෝ.ඇ. 25 හේ එක් එක් කි.වෝ.ඇ. වෙනුවෙන් කි.වෝ.ඇ. එකක් රු. 16 බැගින්.

උපරිම අවශ්‍යතාවේ කි.වෝ.ඇ. 25 ට වැඩි වූ කි.වෝ.ඇ. 50 ට නොවැඩි එක් එක් කි.වෝ.ඇ. වෙනුවෙන් කි.වෝ.ඇ. එකක් රු. 14 බැගින්.

උපරිම අවශ්‍යතාවේ කි.වෝ.ඇ. 50 ට වැඩි සෑම කි.වෝ.ඇ. එකක් රු. 12 බැගින්.

4. කවර මාසයක් වෙනුවෙන් වුවද අඩුම ගාස්තුව වනුයේ රු. 320 කි.

5. එක් එක් පහන් අල්ලුවක් වෙනුවෙන් වොට් 25 කට නොඅඩු පහන් බැර තක්සේරුවකට අවශ්‍යතා ගාස්තු උපලේඛනය යටත් වනු ඇත.

6. සියන් පංකා බැර තක්සේරු කල යුත්තේ එකකට වොට් 50 බැගින්.

ගාස්තු අංක. 7 (තාවකාලික ආලෝක කිරීම් සඳහා)

1. දැනට පවත්නා මනුවට අතිරේක අවශ්‍යතාව දැරිය හැකිනම් දැනට සිටින පාරිභෝගිකයන්ගෙන් ඔවුනට නියමිත ගාස්තු ක්‍රම අනුව විදුලි බල ගාස්තු අය කරනු ලැබේ.

(අ) දැනට පවත්නා මනුවක් මගින් විදුලි බලය සපයන විට විදුලිබල ගාස්තුවට අතිරේකව රුපියල් 5 ක ගාස්තුවක් අයකරනු ලැබේ.

(ආ) විශේෂ මනුවක් මගින් විදුලි බලය සපයන විට අංක. 1 දරණ පොදු ගාස්තු ක්‍රමයට අතිරේක රුපියල් 10 ක ගාස්තුවක් අයකරනු ලැබේ. මෙම ගාස්තු ක්‍රමය ප්‍රසිද්ධ සිද්ධස්ථානවලට අදාල නොවන්නේ ය.

2. තාවකාලික පාරිභෝගිකයන් ගෙන් අංක. 1 දරණ පොදු ගාස්තු ක්‍රමය යටතේ විදුලි බල ගාස්තු අයකරනු ලැබේ. මීට අතිරේකව මනු සහ සේවා ගාස්තු අයකරනු ලැබේ.

ගාස්තු අංක. 8 (ප්‍රසිද්ධ සිද්ධස්ථාන සඳහා)

මෙම ගාස්තු ක්‍රමය මහජනයා වැඳුම් පිදුම් කරන ස්ථානයක් ඇතුළත පිහිටියාවූත්, වැඳුම් පිදුම් කරන ස්ථානයේ පූජකවරුන් පදිංචිව සිටින්නාවූත්, නේවාසිකාගාර ඇතුළු ප්‍රසිද්ධ සිද්ධස්ථානවල භාවිතා කෙරෙන විදුලිය සැපයීම වෙනුවෙන් අදාල වන්නේ ය.

ඒකකයක් ශත. 20 බැගින්.

මනු කුලිය රු. 1 යි.

**විවිධ ගාස්තු**

1. ස්ථාපනය පරීක්ෂා කිරීම :

(අ) නව ස්ථාපන සහ පවත්නා ස්ථාපන විශාල කිරීම් පළමුවරට පරීක්ෂා කිරීම නොමිලයේ.

(ආ) පළමුව පරීක්ෂණය අසතුටුදායක නම් එක් එක් අතිරේක පරීක්ෂණයක් සඳහා—
සම්පූර්ණ ස්ථාපනය රු. 5 යි
විශාල කිරීම් රු. 10 යි.

2. මනු පරීක්ෂා කිරීම් :
පාරිභෝගිකයාගේ අයදුම් මත මනුව පරීක්ෂා කිරීමට රු.    යි.
මනුවේ දෝෂය සියයට 2 1/2 කට අඩු හෝ වැඩි නම් ගාස්තුව ආපසු දෙනු ලැබේ.

3. නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු :

(අ) මුදල් නොගෙවීම මත විසම්බන්ධ කරනු ලැබූ සැපයුම නැවත සම්බන්ධ කිරීම රු. 10 යි.

(ආ) නියෝගය කඩ කිරීම මත විසම්බන්ධ කරනු ලැබූ සැපයුම නැවතත් සම්බන්ධ කිරීමට රු. 15 යි.

(ඇ) පැය 48 කට අඩු කාලයකින් දැනුම් දුන් විට විශේෂ නැවත සම්බන්ධ කිරීමේ ගාස්තුව රු. 2 යි.

4. සැපයුම බිඳ වැටීම.

විලායකකරුවන්ගේ සේවය සඳහා ගාස්තුව රු. 2 යි.

**සටහන්**

1. ගාස්තු ක්‍රම අංක. 5 සහ 6—මුළු පරිහරණ ප්‍රමාණයටම, අදාල ගාස්තු ක්‍රමය යටයේ මුදල් අයකෙරෙනු ඇත. එසේ නැතහොත් පාරිභෝගිකයාගේ කැමැත්ත පරිදි පහන්, පංකා, ශීතකරණ සහ අධි ශීතකරණ සඳහා අංක. 1 දරණ ගාස්තු ක්‍රමය යටතේ ද ගාමක බලය සඳහා සහ විද්‍යුත් රසායනික නැතහොත් විද්‍යුත් තාපක ක්‍රියා අංක. 2 දරණ ගාස්තු ක්‍රමය යටතේ ද මුදල් අය කෙරෙනු ඇත. අංක. 4 දරණ ගෘහිය ගාස්තු ක්‍රමයේ 4 වැනි ඡේදය යටතේ වෘත්තිය හෝ වෙළඳ බැර තක්සේරු කිරීමේදී ස්ථාවර ගාස්තුව ප්‍රමාණානුකූල ක්‍රමයකට කිට්ටුම ඊළඟ සම්පූර්ණ රුපියලට නිශ්චය කෙරෙනු ඇත. මෙහිදී අංක. 6 දරණ ගාස්තු ක්‍රමයේ 2 වැනි ඡේදය යටයෝ අඩුම ගාස්තුව අදාල නොවන්නේ ය.

මසකින් කොටසකට සැපයුම සඳහා ස්ථාවර ගාස්තුව අඩුම ගාස්තුව හා මනු කුලිය ප්‍රමාණානුකූල ක්‍රමයකට ගණන් ගනු ඇත.

උපරිම අවශ්‍යතා කි.වෝ.ඇ. වනුයේ මිනිත්තු 15 ක කාලයක් තුල ප්‍රකාශිත වෝල්ටියතාව අනුව ගිනු විදුලි බල ප්‍රමාණය වේ.

9 3 3—73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**උඩපළාත කඳුකර පහළ ගම්සභාව**

අතුර ව්‍යවස්ථා

මෙම අතුරු ව්‍යවස්ථා උඩපළාත් කඳුකර පහළ ගම්සභාවේ මධ්‍ය පුස්තකාලයේ අතුරු ව්‍යවස්ථා නමින් හැඳින් වේ.

උඩපළාත කඳුකර පහළ ගම්සභාව මගින් පාලනය කරනු ලබන පුස්තකාලය පහත සඳහන් අංශයන්ගෙන් සමන්විත වේ :—

(අ) මධ්‍යම පුස්තකාලය ;

(ආ) කියවීම් ශාලාව.

2. (1) මෙම පුස්තකාලය සහ කියවීම් ශාලාව පිළිබඳ සම්පූර්ණ වගකීම හා පාලනය උඩපළාත කඳුකර පහළ ගම්සභාව සතු වේ. පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරව පැවැත්වීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් සභාපති තුමාට උපදෙස් ලබාගැනීම් සඳහා සුදුසු උපදේශක මණ්ඩලයක් පත්කර ගත හැකිය.

(2) පුස්තකාලය සහ කියවීම් ශාලාව නිසියාකාර පැවැත්වීමට හා පාලනය කිරීම ආදි කටයුතු සභාපතිතුමාගේ උපදෙස් අනුව "පුස්තකාල භාරකරු" විසින් ඉටු කළ යුතුය.

3. පුස්තකාල සේවය ඕනෑම කෙනෙකුට හෝ අනුමත කරන ලද ප්‍රජාමණ්ඩලයකට පාවිච්චි කිරීමට අවසර දීම හෝ නොදීම සභාපති තුමා සතු බලයකි. තවද පාලන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කරන ඕනෑම කෙනෙකුට හෝ ප්‍රජාමණ්ඩලයකට මෙම අවසරය නොදී සිටීමට සභාපති තුමාට බලය තිබේ.

**4. මධ්‍යම පුස්තකාලය.**—(1) පුස්තකාලයේ සාමාජිකයෙකු වීමට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(අ) වයස අවුරුදු 12කට නොඅඩු වීම ;

20. යම් සාමාජිකයෙකු ඉල්ලා අස්වූ විට, නැතිනම් 19 වැනි රීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට ඔහුගෙන් පුස්තකාලයට ලැබෙන්නට තිබෙන මුදලක් වේ නම් එය ඔහු විසින් 4(1) (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් කරන ලද මුදලින් අඩුකර ඉතිරි මුදල් ඔහුට ගෙවනවා ඇත.

(2) යම් සාමාජික ප්‍රජාමණ්ඩලයක් ඉල්ලා අස්වූ විට නැත්නම් 19(1) දරණ රීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට එම ප්‍රජාමණ්ඩලයෙන් පුස්තකාලයට ලැබෙන්නට තිබෙන යම් මුදලක් වේ නම් එය එකී ප්‍රජාමණ්ඩලය විසින් 4(4) (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් කරන ලද මුදලින් අඩු කරනු ලැබේ.

21. සෙනසුරාදා දිනයන්, ඉරිදා දිනයන්, රජයේ නිවාඩු දිනයන් සහ සභාපතිතුමා විසින් නියම කරනු ලබන දිනයන් හැර අනිත් දිනවල දිනපතා ප. ව. 1.30 සිට 3 දක්වාත් සෙනසුරාදා දිනවල පෙ. ව. 8.30 සිට 11.30 දක්වාත් පුස්තකාලය විවෘතව තබනු ලැබේ.

**කියවීම් ශාලාව**

22. කියවීම් ශාලාව පාවිච්චි කරනු ලබන සෑම කෙනෙක්ම :—

(i) ඒ සඳහා පුස්තකාලය භාරකරුගෙන් නිසිවූ පරිදි අවසර ලබා ගත යුතුය.

(ii) කියවීම් ශාලාවේ තබා ඇති නාම ලේඛනයේ තමන්ගේ නම අත්සන් කර තැබිය යුතුය.

23. පහත සඳහන් සුදුසුකම් ඇති ඕනෑම කෙනෙකුට කියවීම් ශාලාව පාවිච්චි කිරීමට අවසර දීමට පුස්තකාලය භාරකරුට පුළුවන.

(i) වයස අවුරුදු 12 ට නොඅඩු වීම,

(ii) සාමාන්‍යයෙන් කියවීම හා ලිවීම දැනගෙන සිටීම,

(iii) ගම්සභා ප්‍රදේශය තුල පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුළ රැකී රක්ෂාවක යෙදී සිටීම.

24. (i) සෙනසුරාදා දිනයන්, ඉරිදා දිනයන් සහ රජයේ නිවාඩු දිනයන් හැර අනිත් දිනවල පෙ. ව. 8.30 සිට පෙ. ව. 12 දක්වාද, ප. ව. 1 සිට ප. ව. 3 දක්වාද, සෙනසුරාදා දිනයන්හි පෙ. ව. 8.30 සිට පෙ. ව. 11.30 දක්වාද කියවීම් ශාලාව විවෘතව තබනු ලැබේ.

(ii) කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ගේ දැනගැනීම සඳහා කියවීම් ශාලාවේ අඩු වශයෙන් දින පහකට (5) වත් කලින් දැන්වීමක් මගින් ප්‍රචාරය කර 24 (1) දරණ ව්‍යවස්ථාවෙන් නියම කර ඇති කාලසීමාවක් වෙනස් කිරීමට සභාපතිතුමාට බලය තිබේ.

25. කියවීම් ශාලාවට අයත් කිසිම පොතක් පතක් සඟරාවක්, සිතියමක්, ලියවිල්ලක් හෝ වෙනත් කිසිම දේපලක් කිසිවෙකුට කියවීම් ශාලාවෙන් පිටතට ගෙනයායුතු නැත.

26. බෝවෙන රෝගයකින් පෙළෙන කිසිම කෙනෙකු රෝග පැතිර යාමේ කාලසීමාව ඉක්මවා යන තුරු "මධ්‍ය" පුස්තකාලයට හෝ කියවීම් ශාලාවට ඇතුල් නොවිය යුතුය.

27. කියවීම් ශාලාව හා පුස්තකාලය තුළ හෝ ඒ අසල නොමනා අන්දමින් හෝ අනුන්ට සිදිහැර වන අන්දමින් නොහැසිරිය යුතුය.

(i) පුස්තකාලය හා කියවීම් ශාලාව තුල හෝ ඒ අවට ඇති ගම් සභාව සතු ගොඩනැගිලි වලට හෝ වෙනත් දේපල වලට කිසිම අලාභයක් නොකළ යුතුය.

(ii) කියවීම් ශාලාව හා පුස්තකාලය වසා ඇති වේලාවන්හිදී නිකරුනේ ඒ අසල නොහැසිරිය යුතුය.

(iii) කියවීම් ශාලාව හා පුස්තකාලය තුළ දුම්බීම හා කෙළ ගැසීම නොකළ යුතුය.

(iv) මධ්‍ය පුස්තකාලය තුළදී හෝ ඒ අසලදී කිසිවෙකු විසින් දාදු වලින් හෝ සූදු කෙළීම හෝ මුදල් ඔට්ටු කිරීම කිසිම ක්‍රීඩාවක් කිරීම හෝ නොකළ යුතුය.

(v) පුස්තකාලය හා කියවීම් ශාලාව ඇතුලත හෝ ඒ අසල කෑ ගැසීම, සිංදුකීම හෝ වෙනත් ශබ්ද ආදිය කිරීමෙන් පුස්තකාලය හා කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය.

(vi) අපිරිසිදු ලෙස කියවීම් ශාලාවට හෝ පුස්තකාලයට ඇතුල් නොවිය යුතුය.

(vii) බල්ලන්, බළලුන් හෝ වෙනත් කිසිම සතුන් පුස්තකාලයට හා කියවීම් ශාලා භූමියට නොගෙනා යුතුය.

(viii) මධ්‍ය පුස්තකාලය හා කියවීම් ශාලාව තුළ හෝ ඒ අසල නිදා ගැනීම හෝ ආහාර ගැනීම නොකළ යුතුය.

(ix) පුස්තකාලය භාරකරු හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය පවරන ලද අයෙකු විසින් අතුරු ව්‍යවස්ථා යටතේ නීත්‍යානුකූලව ඉටු කරනු ලබන කටයුතු වලට කිසිවෙක් විසින් බාධා නොකළ යුතුය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවල :—

"සභාපතිතුමා" යනුවෙන් ගම්සභාවේ සභාපතිතුමාද,

"ගම්සභාව" යනුවෙන් උඩ පළාත කඳුකර පහළ ගම්සභාවද,

"ගම්සභා ප්‍රදේශය" යනුවෙන් උඩ පළාත කඳුකර පහළ ගම්සභා ප්‍රදේශයද,

"පුස්තකාල භාරකරු" යනුවෙන් ගම්සභාව මගින් පත්කරන ලද හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පුස්තකාලයාධිපතිද,

"සාමාජිකයෙකු" යනුවෙන් 4(1) වැනි ව්‍යවස්ථාව යටතේ සාමාජිකත්වය ලැබූ අයෙකු හෝ 4(4) වන ව්‍යවස්ථාව යටතේ සාමාජිකත්වය ලැබූ ප්‍රජාමණ්ඩලයක්ද අදහස් කරනු ලැබේ.

මෙයට,
අ/ක. දි. මූ. ජයරත්න,
සභාපති,
උඩ පළාත කඳුකර පහළ ගම්සභාව.

1973 ජූලි 13 වැනි දින,
උඩපළාත කඳුකර පහළ ගම්සභාව,
දෙලුව-ගම්පල.

7-892—73.07.27 දින අංක 70 දරන ගැසට් පත්‍රය

---

**ප්‍රාදේශීය බල මණ්ඩල (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් (261 වන අධිකාරයවන) ප්‍රාදේශීය බල මණ්ඩල (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර 1972. 11. 03 වැනි දින අංක 32 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පලකරන ලද මෙහි පහත සඳහන් සංශෝධිත අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත් එය ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පලවන දින සිට පාලින්ද නුවර ගම්සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත් 1973. 07. 12 වැනි දින පැවැත්වූ පාලින්ද නුවර ගම්සභාවේ මාසික සභා රැස්වීමේ අංක 2 දරණ සභා සම්මුතිය යටතේ පාලින්ද නුවර ගම්සභාවේ ඒකමතිකව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ජී. ඇස්. අප්පුහාමි,
පාලින්ද නුවර ගම්සභාවේ සභාපති.

1973. 07. 16 දින,
පාලින්ද නුවර ගම්සභා කාර්යාලයේ දී ය.
බදුරලිය, ලත්පඳුර.

**පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

මෙම අතුරු ව්‍යවස්ථාව පාලින්ද නුවර ගම්සභාවේ මධ්‍ය පුස්තකාල අතුරු ව්‍යවස්ථා නමින් හැඳින්වේ.

1. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය නොවුවහොත් මේ අතුරු ව්‍යවස්ථාවල "පුස්තකාලයාධිපති" යන්නෙන් පුස්තකාලය භාරව සිටීම පිණිස සභාව විසින් පත්කරනු ලබන තැනැත්තා අදහස්වන අතර ඔහුගේ සහකරුවෝද එයට ඇතුලත් වෙති.

2. සභාව විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන මහජන පුස්තකාලය :—

(අ) පොත් පත් බැහැරට දෙන පුස්තකාලයකින්
(ආ) ආශ්‍රය පුස්තකාලයකින්
(ඇ) කියවීම් ශාලාවකින් සහ
(ඇ) පහත දැක්වෙන දැ එනම්

(i) පුස්තකාලයේ ළමා අංශයක්
(ii) ප්‍රජාමණ්ඩලවලට සහ ඒ හා සමාන අනුමත ප්‍රජා ව්‍යාපාරවලට තාවකාලිකව පාවිච්චියට පොත් දීම සහ
(iii) පළාත් පාලන කොමසාරිස් වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව සභාව විසින් අනුමත කරන ලද වෙනත් යම් පුස්තකාල සේවයක්.

යන මේවා අතුරින් කවරකින් හෝ සමන්විත වන ව්‍යාප්ත පුස්තකාල සේවයකින් සමන්විත විය හැක.

3. 1. මහජන පුස්තකාලයේ පරිපාලනය හා සාමාන්‍ය පාලනය මින්පසු මෙහි "කාරක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන

(අ) සභාවේ එවකට සිටින සභාපති ගෙන්,
(ආ) සභාව විසින් තෝරා පත්කර ගනු ලබන හතර දෙනකුට වැඩි නොවූ සභාවේ වෙනත් සාමාජිකයන් ගණනකින් සහ
(ඇ) සභාව විසින් තෝරාගනු ලබන සභාවේ පාලන සීමාව ඇතුලත පදිංචි ප්‍රසිද්ධ තැනැත්තන් පස් දෙනකු ගෙන්ද, යුක්තවූ පුස්තකාල කාරක සභාවක් වෙත පැවරිය යුතුය.

2. පුස්තකාලය භාරව සිටිය යුතු පුස්තකාලාධිපතියකු සභාව විසින් පත් කළ හැකි අතර, ඒ පුස්තකාලය ඇතුලත මනා විනය පවත්වා ගෙන යාම ගැන ඔහු වග කිව යුතුය.

මුදලක් වෙතොත් එය අඩු කර ගෙන ඒ තැනැත්තාගේ සාමාජිකත්වය කෙළවර වීමේදී ඔහුට ආපසු ගෙවිය යුතුය.

24. පොත් පත් බැහැරට දෙන පුස්තකාලය, ඉරිදා දිනවල සහ රජයේ නිවාඩු දිනවලත්, තොග ගණන් බැලීම සඳහා කාරක සභාව විසින් යටත් පිරිසෙයින් දින හතක්වත් දැන්වීමක් දෙනු ලැබ මෙන් පසුව නියම කර ගනු ලබන වෙනත් යම් දිනවලත් හැර දිනපතා පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා වූ කාලය තුළ විවෘත කර තැබිය යුතුය.

**ආශ්‍රය පුස්තකාලය**

25. කිසිම තැනැත්තෙකු—

(අ) ඒ සඳහා පුස්තකාලයාධිපතිගෙන් අවසර ලබා ගෙන ඇති නම් සහ

(ආ) ආශ්‍රය පුස්තකාලයෙහි තබා තිබෙන ලේඛණය අත්සන් කර ඇති නම් මිස තමා විසින් ආශ්‍රය පුස්තකාලයෙන් ප්‍රයෝජනය නොගත යුතුය.

26. පුස්තකාලයාධිපති විසින්—

(අ) අකුරු කියවීම දන්නාවූ

(ආ) සභාවේ පාලන සීමාව තුළ පදිංචි කරුවෙකු වූ සහ

(ඇ) වයස අවුරුදු දහහතරකට අඩු නොවූ

යම් තැනැත්තෙකුට ආශ්‍රය පුස්තකාලයෙන් ප්‍රයෝජනය ගැනීමට අවසර දිය හැකිය.

27. කිසිම තැනැත්තකු විසින් ආශ්‍රය පුස්තකාලයෙහිදී බැලීම සඳහා තමා වෙත නිකුත් කරනු ලැබූ කිසිම පොතක් ආශ්‍රය පුස්තකාලයෙන් බැහැරට ගෙන නොයා යුතුය.

28. (1) මෙම අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ විධි විධාන වලට යටත්ව ආශ්‍රය පුස්තකාලය, පොහෝ දිනයක හෝ රජයේ නිවාඩු දිනයක හැර වෙනත් ඕනෑම දිනයක පෙරවරු 8.30 සිට පස්වරු 5.00 වත් අතර කාලය තුළ විවෘත කර තැබිය යුතුය.

(2) සභාව විසින්—

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයෙහි නිශ්චිතව සඳහන් කාලවේලාවල් දීර්ඝ කිරීම.

(ආ) බඩු ගණන් ගැනීම සඳහා සභාව විසින් නියම කළ හැකි යම් යම් දිනවල ආශ්‍රය පුස්තකාලය වසා තැබීමට කාරක සභාවට නියම කිරීම.

යෝජනා සම්මුතියෙන් කළ හැකිය.

**කියවීම් ශාලාව**

29. කිසිම තැනැත්තකු—

(අ) ඒ සඳහා පුස්තකාලයාධිපති ගෙන් අවසර ලබා ඇතොත් සහ

(ආ) කියවීම් ශාලාවේ තබා තිබෙන ලේඛණය අත්සන්කර ඇත හොත් මිස, තමා විසින් කියවීම් ශාලාව පාවිච්චි නොකළ යුතුය.

30. (අ) අකුරු කියවීමට දන්නා

(ආ) සභාවේ පාලන සීමාව තුල පදිංචිව සිටින සහ

(ඇ) වයස අවුරුදු දහහතරකට අඩු නොවූ යම් තැනැත්තකුට පුස්තකාලය පාවිච්චි කිරීමට පුස්තකාලයාධිපති විසින් අවසර දිය හැකිය.

31. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ විධි විධාන වලට යටත්ව, පොහොය දිනයක් හෝ රජයේ නිවාඩු දිනයක් නොවන සතියේ කවර දිනක වුවත් පෙරවරු 8.30 සිට පස්වරු 5.00 දක්වා කාලය තුල කියවීම් ශාලාව විවෘතකර තැබිය යුතුය.

(2) සභාව විසින්—

(අ) මේ අතුරු ව්‍යවස්ථාවේ (I) වැනි ඡේදයෙහි නිශ්චිතව සඳහන් කාලය දීර්ඝ කිරීම.

(ආ) යෝජනාවේ නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි පොහොය දිනයක හෝ රජයේ නිවාඩු දිනයක යම් යම් කාලවේලා වලදී කියවීම් ශාලාව විවෘත කර තබන ලෙස කාරක සභාවෙන් ඉල්ලා සිටීම හෝ

(ඇ) බඩු ගණන් බැලීම සඳහා සභාව විසින් නියම කරනු ලබන දිනවලදී කියවීම් ශාලාව වසා තබන මෙන් කාරක සභාවට නියම කිරීම.

යෝජනා සම්මුතියෙන් කළ හැකිය.

32. කියවීම් ශාලාවේ තබා තිබෙන හෝ ඊට අයිති යම් ප්‍රවෘත්ති පත්‍රයක්, වාර සංග්‍රහයක්, සඟරාවක්, සිතියමක්, ලේඛණයක්, අත් පිටපතක් හෝ වෙන යම් දෙයක් කිසිම තැනැත්තෙකු විසින් කියවීම් ශාලාවෙන් පිටතට ගෙන නොයා යුතුය.

33. යෝජනාවක් මගින් යෝජනාවේ සඳහන් යම් යම් නිශ්චිත කාල සීමාවන් තුල පොහොය දිනයක හෝ රජයේ නිවාඩු දිනයක ආශ්‍රය පුස්තකාලය, බැහැරට දෙන පුස්තකාලය සහ කියවීම් ශාලාව විවෘත කර තැබීමට සභාව විසින් කාරක සභාවට නියම කළ හැකිය.

**සාමාන්‍ය කරුණු**

34. බෝවෙන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී පෙළෙමින් සිටි හෝ එවැනි රෝගයකින් පෙළුනු යම් කෙනෙකුට මෑතකදී සාත්තු කරමින් සිටි කිසිම තැනැත්තෙකු විසින් ඒ රෝග බීජ මෙරීමට හා රෝගය බෝවීමට ගතවන කාල සීමාව පසුවන තෙක් මහජන පුස්තකාලයට අයත් ස්ථානයට ඇතුළු නොවිය යුතුය.

35. කිසිම තැනැත්තෙකු විසින්—

(1) මහජන පුස්තකාලයට අයිති ස්ථානය ඇතුලත සෝ ඒ අසල අනිසි ලෙස හැසිරීම හෝ පීඩාවක් ඇති වන කිසිම දෙයක් කිරීම.

(2) සභා ගොඩනැගිල්ලේ කිසිම කොටසක හෝ මහජන පුස්තකාලය තුල හෝ ඒ අසල වූ සභාවට අයත් කිසිම දේපළකට හානියක් කිරීම හෝ එය මොනම අන්දමකින්වත් විරූපී කිරීම.

(3) තමා ගැන සතුටුදායක විස්තරයක් කිරීමට නොහැකිව මහජන පුස්තකාලය වැසීමෙන් පසු ඒ පුස්තකාලයට අයිති ස්ථානයක රැඳී සිටීම හෝ නිකරුනේ ගැවසීම.

(4) මහජන පුස්තකාලයට අයත් ස්ථානය ඇතුළත දුම්බීම හෝ කෙළ ගැසීම.

(5) මහජන පුස්තකාලයට අයත් සථානය ඇතුළතදී දදුකෙළීම හෝ කඩදාසි කුට්ටමෙන් සුදු කෙලීම හෝ අන් කිසි ක්‍රීඩාවක් කිරීම.

(6) පුස්තකාලය ඇතුළතදී කෑගැසීමෙන් හෝ ගී සින්දු කීමෙන් හෝ වෙනයම් ඝෝෂාවක් කිරීමෙන් මහජන පුස්තකාලය පාවිච්චි කරන්නන්ට කරදර කිරීම.

(7) අපිරිසිදු තත්ත්වයකින් මහජන පුස්තකාලයට අයිති ස්ථානයට ඇතුළුවීම.

(8) මහජන පුස්තකාලයට අයත් ස්ථානය තුළට යම් බල්ලකු හෝ වෙන යම් සතෙකු ගෙන ඒම.

(9) මහජන පුස්තකාලයට අයත් ස්ථානයේ යම් කොටසක නිදා ගැනීම හෝ යම් කිසි ආහාරයක් ගැනීම.

(10) මේ අතුරු ව්‍යවස්ථා යටතේ තමා වෙත පැවරී ඇති බලතල නීත්‍යානුකූලව පාවිච්චි කිරීමෙහිදී පුස්තකාලයාධිපතිට හෝ ඔහුගේ අණ පරිදි ක්‍රියා කරන යම් තැනැත්තෙකුට අවහිර කිරීම. නොකළ යුතුය.

36. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති තුමා" යනුවෙන් ගම්සභාවේ සභාපති තුමාද,

"ගම්සභාව" යනුවෙන් පාලින්ද නුවර ගම්සභාවද,

"ගම්සභා ප්‍රදේශ" යනුවෙන් කළුතර දිස්ත්‍රික්කයේ පාලින්ද නුවර ගම්සභා ප්‍රදේශයද,

"පුස්තකාලයාධිපති" යනුවෙන් පාලින්ද නුවර ගම්සභාව මගින් පත්කර ඇති අයද,

"සාමාජිකයා" යනුවෙන් (7) (1) වන රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ අයද, අදහස් වේ.

ජී. ඇස්. අප්පුහාමි,
පාලින්ද නුවර ගම්සභාවේ සභාපති තැන.

1973. 07. 16 දින,
පාලින්ද නුවර ගම්සභා කාර්යාලයේ දී ය.
බදුරලිය,
ලත්පඳුර.

7-907 —73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

---

**තංගල්ල නගර සභාව**

ජල භීතිකා රෝගය

තංගල්ල නගර සභා සීමාව තුල ජල භීතිකා උවදුර පවත්නා බැවින් එම නගර සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිඩ ස්ථානයක හෝ පාරක හමුවන, දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලේම විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදයේ) ජල භීතිකා ආඥා පණතේ 11 වන වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය ගැසට් පත්‍රයේ පලවන දින සිට ඉදිරියට මාස 6ක කාලයකට වලංගුවේ.

එච්. ජී. ආනන්ද,
තංගල්ල නගරයේ විශේෂ කොමසාරිස්.

1973. 06. 26 වෙනි දින,
තංගල්ල විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

7-969 —73. 07. 27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

**පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින 15,001 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද සංශෝධිතයට දක්වන xviii වැනි කාණ්ඩය පිළිගැනීමටත් එය ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවන දින සිට තණතර දිස්ත්‍රික්කයේ පාලින්ද නුවර ගම්සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත් 1973.07.12 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී සභා සම්මතයෙන් තීරණය කළ බැව් ප්‍රකාශ කරමි.

ජී. ඇය් අප්පුහාමි,
පාලින්ද නුවර ගම්සභාවේ සභාපති.

1973 ජූලි 16 වැනි දින,
බදුරලියේ, පාලින්ද නුවර ගම්සභා කාර්යාලයේ දී ය.

අතුරු ව්‍යවස්ථාව

කලින් කළ සංශෝධනය කරන ලද පරිදිවූ 1953 අප්‍රියෙල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල xviii වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යපාර වලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ.

1. එහි I වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත, පරිදි I වැනි කොටසේ II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" .නවද

2. එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන්,

උපලේඛනය

I වැනි කොටස

**අන්තරාදායක ව්‍යාපාර**

කබුක්, බොරළු හෝ කලුගල් කැනීම.
කබුක්, බොරළු හෝ කලුගල් ගබඩාකිරීම.
සිසිල් බීම නිෂ්පාදනය.
ග්‍රෝස් එකට වැඩි ප්‍රමාණයක සිසිල් බීම ගබඩාකර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම. සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිස්කර්ශණය.
ගැළුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබා ගැනීම.
පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් හෝ ගබඩා කර තබා ගැනීම.
ගිනි පෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 කට වැඩි ප්‍රමාණයක් ගිනි පෙට්ටි ගබඩාකර තබා ගැනීම.
ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් ගබඩාකර තබා ගැනීම.
මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
ගඩොල් හෝ උළු ගබඩා කර තැබීම හෝ පිච්චීම.
තේ පෙට්ටි හෝ ලෑලි නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
පිදුරු ගබඩාකර තබා ගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩාකර තබා ගැනීම.
කුලියට දීමට ලාම්පු ගබඩාකර තබාගැනීම.
ධාන්‍ය හෝ මාෂ භෝග වර්ග හොන්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත් වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.
අතින් ලී ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.
දැව ගබඩාවක් පවත්වාගෙන යාම.
ගිරි ගල් හෝ හුනු ගල් සඳහා කැනීම.
දර ගබඩාවක් පවත්වා ගෙන යාම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙණ කම්හලක් පවත්වාගෙන යාම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යාම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොන්ඩර 15 කට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩාකර තබා ගැනීම.
බයිසිකල හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම.
අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ට්‍යුබ් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොන්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල්කටු ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
සිල්ක් සහ කෘතිම රෙදි විවීම හා විසිතුරු කිරීම.
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

II වැනි කොටස

අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් සුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පොර හෝ රසායනික පොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
සම් ගබඩාකර තබා ගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොන්ඩර 5ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩාකර තබා ගැනීම.
කුකුළන් 100කට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පශු වෛද්‍ය හිලන්හලක් පවත්වාගෙන යාම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුලු කෑම වර්ග හා ආහාර වර්ග ගබඩා කර තබා ගැනීම.
කරවල, ලුණු මාළු හෝ ජාඩි හොන්ඩර 3ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම.
සිමෙන්ති හොන්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම.
පූන්නක්කු ටොන් 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මයියොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙනයාම.
ටින්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැල්වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.
පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.
මේද නිපදවීම හෝ නිශ්කර්ෂණය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
විනාකිරි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
හුණුගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම.
පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොන්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
සෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.
කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.
සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
පළතුරු. මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇහිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මාශ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග කෙටීම.
බේකින් පවුඩර් නිපදවීම.
මාජරීන් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.
පොටි නිපදවීම.

ඉටිපන්දම් නිපදවීම. ...
කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ පුයර නිපදවීම.

පාසැල් රටහුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙනයාම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.
පාසැල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

ශීත කළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම.
කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
මැණික් ගල් කැපීම හෝ ඔප දැමීම.

දිය හුණු සුදු (වයිට්ං) හුණු හෝ හිරිගල් නිපදවීම.
එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස

### අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම..

ඩ්‍රයික්ලීනිං කරන ස්ථානයක් හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.

රෙදි මුද්‍රණය කරන හෝ සසායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

තෙල් හෝ සත්ව මේද පැසවීම.
හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

හොණ්ඩර 5 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම.

බැටරි චාර්ජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම..
මෝටර් වාහන සර්විස් කිරීම් හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.
ගල් ස්මාරක නිපදවීම.

පැට්‍රල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.
පැට්රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.
මදුරු කොයිල් (කොයිල්ස්) නිපදවීම.

ලී දඹු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.
රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.
ගල් තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම.
වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටුකම්බි නිපදවීම.
කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.
ජී. අයි. බාල්දි නිපදවීම.
වායු සමන යන්ත්‍ර, ශීතකරණ, හෝ අධි ශීතකරණ (ඩීප් fප්‍රීසර්) නිපදවීම.

සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.
විදුලි භාණ්ඩ නිපදවීම.
රබර් කැවුනු කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.
වියලි කෝෂ බැටරි නිපදවීම.
ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිශ්කරණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.
රේඩියේටර් නිපදවීම.
විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම.

7-908—73.7.27 දින අංක 70 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.**

**ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.**

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.**

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.29 | සිකුරාද | දවල් 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.06 | සිකුරාද | දවල් 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.13 | සිකුරාද | දවල් 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.20 | සිකුරාද | දවල් 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.27 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.03 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.10 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.17 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.24 | සිකුරාද | දවල් 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.31 | සිකුරාද | දවල් 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.07 | සිකුරාද | දවල් 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.14 | සිකුරාද | දවල් 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.21 | සිකුරාද | දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.